# වධහිංසාවෙන් තොර සමාජයක්

## වධ හිංසාව නිවාරණය පිළිබඳ නීතිමය සටහනක්

**වධහිංසාව පිළිබඳ අධීක්ෂණය හා දැනුවත් භාවය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය**

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

**AusAID** අනුග්‍රහයෙනි

# වධහිංසාවෙන් තොර සමාජයක්

## වධහිංසාව නිවාරණය පිළිබඳ නීතිමය සටහනක්

වධ හිංසාව පිළිබඳ අධීක්ෂණය හා දැනුවත් භාවය
ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**AusAID** අනුග්‍රහයෙනි

© ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

# වධ හිංසාවෙන් තොර සමාජයක්

## වධ හිංසාව නිවාරණය පිළිබඳ නීතිමය සටහනක්

පළමු මුද්‍රණය : 2003 අගෝස්තු

ISBN : 985-8929-00-X

සංස්කරණය : ආර්. සී. කරුණාකරන්
ජගත් බණ්ඩාර ලියනආරච්චි
වී. ගන්ගාධරන්
ජේනක දිසානායක

සංස්කරණ සහාය : වාසුකි දේවදාසන්
එස්. විජයානන්දන්
අනුරාධා ගුණරත්න

මුද්‍රණය : ප්‍රින්ට් ලයින්
58/3, ඩී. එම්. කොළඹගේ මාවත
කිරුළපන, කොළඹ 05.

ප්‍රකාශනය : වධහිංසාව පිළිබඳ අධීක්ෂණය හා දැනුවත්භාවය
ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
අංක 36 කිංසි පාර,
කොළඹ 08

# පෙරවදන

" වධ හිංසාවෙන් නිදහස්වීම " හිමිකමක් ලෙස ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රකාශණ හා සම්මුතින් මගින් පිළිගෙන ඇති අතරම, එය මූලික අයිතිවාසිකමක් ලෙස ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කොට ඇත.

වධ හිංසාවෙන් තොර සමාජයක් බිහිකිරීම අරමුණු කොට ගෙන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඕස්ට්‍රේලියානු ඒජන්සියෙහි (AusAID) අනුග්‍රහය මත ක්‍රියාත්මක කළ "වධ හිංසාව පිළිබඳ අධීක්ෂණය හා දැනුවත් භාවය ප්‍රවර්ධනය කිරීමේ" ව්‍යාපෘතියෙහි එක් අදියරක් ලෙස මෙම පොත ඔබ අතට පත් වනු ඇත.

වධ හිංසාව පිළිබඳ පවතින නීතිරීති හා ජාත්‍යන්තර සම්මුතීන් වලට අතිරේකව මෙම පොත වර්ණවත් කිරීමට විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු පී. ආර්. ප්‍රියන්ත පෙරේරා මහතා විසින් පවතින නීතිමය තත්වයන් හා අධිකරණ තීන්දු පිළිබඳ අගනා ලිපියක් එක් කරන ලදී.

මෙම පොත මගින් සිදුවූ එක් වැදගත්ම කාර්යයක් වනුයේ වධහිංසාවලට සහ වෙනත් කෲර අමානුෂික හෝ අවමන් සහගත සැළකිලිවලට හෝ දඬුවම්වලට එරෙහි සම්මුතිය සිංහල භාෂාවෙන් පරිවර්ථනය වීමය. වධහිංසා වැළැක්වීම සඳහා පවතින නීතිරීති හා ජාත්‍යන්තර සම්මුතීන් පිළිබඳ අධ්‍යනය කරන නීති සිසුනට හා නීතිවේදීනට, පාසල් සිසුන්ට, ගුරුවරුන්ට, රජයේ හා රාජ්‍ය නොවන සංවිධාන නිලධාරීන්ට සිවිල් සමාජක්‍රියාකාරිකයන්ට හා ප්‍රතිපත්ති සම්පාදකයනට මෙම පොත මහඟු උපකාරයක් වනු ඇත.

# පෙළගැස්ම

පිටුව


## පරිච්ඡේදය - 01

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වැනි ව්‍යවස්ථාවේ අර්ථ විග්‍රහය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන ලද තීරණාත්මක ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දු. 1
   - පී. ආර්. පී. පෙරේරා - විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු

## පරිච්ඡේද - 02

2. වධ හිංසාව හා අනෙකුත් කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකීම හෝ දඬුවමකට එරෙහි සම්මුතිය 9

3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදය 35

4. 1994 අංක 22 දරණ වධදීමට සහ අනෙකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැලකීමට හෝ දඬුවම් වලට එරෙහිවූ සම්මුතිය පනත 45

# පරිච්ඡේදය I

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 11 වැනි ව්‍යවස්ථාවේ අර්ථ විග්‍රහය පිළිබඳව විශේෂ අවස්ථාවක් යොමු කරන ලද තීරණාත්මක ශ්‍රේෂ්ඨාධිකරන නඩු තීන්දු.

පී. ආර්. පී. පෙරේරා - විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු

හැඳින්වීම.

මූලික අයිතිවාසිකම් යනු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10, 11, 12(1), 12(3) සහ 13 වන ව්‍යවස්ථා යටතේ සෑම තැනැත්තෙකුටම හිමිකම් ඇති අයිතිවාසිකම් සහ නිදහස වන අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15 වන ව්‍යවස්ථාව යටතේ "නීතියෙන් නියම කරනු ලැබිය හැකි" සීමාකිරීම්වලට යටත්ව, එම අයිතිවාසිකම් වලට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(2) සහ 14 වන ව්‍යවස්ථා යටතේ සෑම පුරවැසියකුට ම හිමිකම් ඇත.

"යම් විධායක හෝ පරිපාලනමය ක්‍රියාවක් මගින්" මූලික අයිතිවාසිකම් කඩකිරීමක් සිදු වූ අවස්ථාවක දී, එකම ප්‍රතිකර්මය වනුයේ 126(2) වන ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 17 වන ව්‍යවස්ථාව යටතේ එම මූලික අයිතිවාසිකම් කඩකිරීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම වේ. ජනාධිපතිවරයාගේ, අමාත්‍යවරයකුගේ, රජයේ නිලධරයකුගේ හෝ රජයේ අනුයෝජිත ආයතනයක හෝ අධිකාරියක ක්‍රියා සාමාන්‍යයෙන් "විධායක හෝ පරිපාලන ක්‍රියාවක්" යටතේ ගැනේ. "අධිකරණමය ක්‍රියාවක්" සහ රාජ්‍ය නිලධරයන්ගේ හුදෙක්ම පෞද්ගලික ක්‍රියා "විධායක හෝ පරිපාලනමය ක්‍රියාවන්" යන ක්ෂේත්‍රය යටතට නොගැනේ. එසේ වුවද, හුදෙක්ම යම් පෞද්ගලික තැනැත්තෙකුගේ ක්‍රියාවන් සිදු කරන ලද්දේ රාජ්‍ය නිලධරයන්ගේ ඉගැන්වීම මත හෝ ඔවුන්ගේ අනු දැනුම ඇතිව නම් එම ක්‍රියා "විධායක හෝ පරිපාලන ක්‍රියා" විය හැකිය.

පෙත්සම්කරුවකුගේ මූලික අයිතිවාසිකම් කඩ කිරීමක් හෝ කඩ කිරීමට ආසන්න වීමක් සම්බන්ධයෙන් සහනයක් හෝ පිළිතක් ලබා දෙන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයෙන් අයැද සිටිමින් ශ්‍රේෂ්ඨාධිකරණය අමතන ලිඛිත පෙත්සමක් මගින් ශ්‍රේෂ්ඨාධිකරණයේ රීතිවලට අනුකූලව පෙත්සම්කරුවකු තමා විසින්ම හෝ තමා වෙනුවෙන් නීතිඥවරයකු විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 (2) ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකිය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් "මූලික" වශයෙන් පිළිගනු ලබන සහ ප්‍රකාශයට පත් කරනු ලබන ඇතැම් අයිතිවාසිකම් සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවේ සඳහන් කර ඇත. ඒවා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ දක්වා ඇති වෙනත් අයිතිවාසිකම්වලට සමාන වන අතර ඒවා ඉතා විශේෂ ස්වභාවික අයිතිවාසිකම් වේ. "කිසිම තැනැත්තකු වධහිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු බවට" මේ ව්‍යවස්ථාව මගින් විධිවිධාන සළස්වයි.

වෙල්මුරුගේසු එදිරිව නීතිපතිවරයා සහ තවත් අය නඩුවේ දී වනසුන්දර විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවට අදාළව පහත දැක්වෙන නිරීක්ෂණ කර ඇත.

"වධ හිංසා සහ හිරිහැර කිරීම්වලට එරෙහිව ලබාදෙන 11 වන ව්‍යවස්ථාවෙහි, එම ව්‍යවස්ථාව වෙනත් මූලික අයිතිවාසිකම් වලින් වෙන්කොට දක්වන අංග කිපයක් ඇත. මෙම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා තුනෙන් දෙකක බහුතරයක් පමණක් නොව ජනමත විචාරණයක් ද අවශ්‍ය වන බැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එසේ සඳහන් වන එකම මූලික අයිතිවාසිකම එය පමණක් වීම තුළින් මෙම ව්‍යවස්ථාවේ සුවිශේෂත්වය එහිදී පෙන්නුම් කෙරේ. එම ව්‍යවස්ථාව III වන පරිච්ඡේදයේ දක්වා ඇති අයිතිවාසිකම් ලැයිස්තුවේ සෑම පුද්ගලයෙකුටම සමානව අදාළ වන්නාවූ ද, කිසිදු ආකාරයකින් සීමා කළ නොහැකි හෝ අඩු කළ නොහැකි වූද එකම අයිතිවාසිකම වේ. වෙනත් අයිතිවාසිකම් සම්බන්ධයෙන් යම් කෙනෙකු කුමක් පැවසුව ද මේ අයිතිවාසිකම නියැකයෙන්ම ප්‍රමුඛ ස්ථානයක රැඳී සිටී. මෙම ව්‍යවස්ථාවේ වැදගත්කම, එහි බලපෑම සහ සමාජයට ඇති ප්‍රතිඵල සැලකිල්ලට ගැනීමේ දී, එය නිවැරදිව විශේෂ සැලකිල්ලක් දැක්වීම සඳහා වෙන් කොට ගත යුතුය.

එම නිසා එම ව්‍යවස්ථාව සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම ද, එහි විධිවිධාන උපරිම ආකාරයෙන් අදාළ කර ගන්නා බවට වගබලා ගැනීම ද මේ අධිකරණයේ කාර්යයකි".

<u>අමල් සුදත් සිල්වා</u> එදිරිව <u>කොඩිතුවක්කු</u> 1987 [2] ශ්‍රී ලංකා නීති වාර්තා 119 හි 126 සහ 127 යන පිටුවල මේ ව්‍යවස්ථාව විශ්ලේෂණය කරමින් අතුකෝරළ විනිසුරු මෙමයේ සඳහන් කරයි. "කිසිම තැනැත්තකු වධහිංසා වලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව මගින් විධාන කරයි. යම් තැනැත්තකු විසින් වෙනත් තැනැත්තකු වෙත වධ හිංසා, කෲර හෝ අමානුෂික සැළකිලි දැක්වීම මේ ව්‍යවස්ථාව මගින් තහනම් කරනු ලබයි. එය කිසිදු සීමා කිරීමකට හෝ අඩු කිරීමකට යටත් කර නොමැති පරම මූලික අයිතිවාසිකමකි. අපරාධකරුවකු වුවද, එසේ නොවුවද, මේ රටේ සෑම තැනැත්තකුටම මේ අයිතිවාසිකම්වල ඇති සම්පූර්ණ කැපවීම පිළිබඳව හිමිකම් ලැබේ. රජයේ අංශයක් වන පොලිස් බලකායට ද මේ අයිතිවාසිකම් ආරක්ෂා කොට සුරැකීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නියම කොට ඇති අතර කිසිදු අවස්ථාගත කරුණක් යටතේ යම් ආකාරයකින් එම අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කිරීම, අඩු කිරීම හෝ සීමා කිරීම නොකළ යුතු බවට පනවා ඇත. පෙත්සම්කරු කිසිදු සමාවක් හිමි නොවිය යුතු වර්ගයේ දරුණු අපරාධකරුවකු විය හැකි වුවද, අපගේ ප්‍රජාතාන්ත්‍රික රටාමේදී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහතිකවීම් වලට යම් අර්ථයක් හෝ වටිනාකමක් ලබා දිය යුතු නම්, එම අපරාධකරුට අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ලබා දී ඇති ආරක්ෂාව ප්‍රතික්ශේප නොකළ යුතු වේ.

<u>ප්‍රනාන්දු</u> එදිරිව <u>සිල්වා සහ තවත් අය</u> හාඩුමෙට් ද (ශ්‍රේෂ්ඨාධිකරණ ඉල්ලීම් 7/89, එස්. සී. එම්. 3/5/1991) නිදාගැනීම ඇතුළු සාමාන්‍ය ශාරීරික කර්තව්‍ය සහ අවශ්‍යතා ඉටුකිරීම සඳහා අවශ්‍ය ආහාර නොමැතිව සිටීම, ප්‍රමාණවත් ආහාර නොමැතිව සිටීම සහ මූලික පහසුකම් නොමැතිව සිටීම සහ යම් තැනැත්තකු වෙනත් අය සමඟ කතාබහ කිරීමෙන් වළකා තැබීම මගින් 11 වන ව්‍යවස්ථාව කඩකිරීමක් සංයුක්ත වන බවට ශ්‍රේෂ්ඨාධිකරණය මගින් තීරණය කරන ලදී.

කෙසේ වුවද, සිල්වා එදිරිව සභාපති, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව නඩුවේදී (1989(2) ශ්‍රී ලංකා නි.වා. 393) යම් ක්‍රියා කලාපයක්, 11 වන ව්‍යවස්ථාව යටතේ කඩ කිරීමක් බවට පත්වීමට නම්, එම ක්‍රියාව අධිකරණය විසින් සැලකිල්ලට ගත හැකි වර්ගයේ ක්‍රියාවක් මිස අත්‍යාකාරයක ක්‍රියාවක් නොවිය යුතුය. ප්‍රස්තුත නඩුවේ දී ස්වකීය සේවා යෝජකයාගේ ඉතා අකාරුණික බව සහ බරපතල සැරපරුෂ බව මගින් 11 වන ව්‍යවස්ථාව කඩවීමක් සිදු නොවූ බවට තීරණය කරන ලදි.

වධ හිංසා, කෘෘර සහ අමානුෂික සහ අවමන් සහගත සැලකිලි හෝ දඬුවම්, ශාරීරික සහ මානසික යනාදී වශයෙන් විවිධ මුහුණුවර ගත හැකිය. නමුත් අදාළ නිර්නායක සපුරා ඇද්ද යන්න එක් එක් සිද්ධියේ අවස්ථානුගතික කරුණු මත තීරණය විය යුතුය. (ශ්‍රේ.අධි. ඉල්ලීම් 7/89, එස්.සී.එම් 3/5/1991) 1989 (2) ශ්‍රී ලංකා නි.වා. 393.)

මේ සම්බන්ධයෙන්, **1994** අංක **22** දරන වධ හිංසා, සහ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිලි හෝ දඬුවම් වලට එරෙහි සම්මුතිය පනතෙහි "වධ හිංසාව" යන වචනයේ අර්ථ නිරූපනය සලකා බැලිම වටී. මේ පනතේ 12 වන වගන්තිය මගින් "වධ දීම" පහත දැක්වෙන ආකාරයට අර්ථ නිරූපනය කර ඇත.

"වධ දීම" යන්නෙහි ව්‍යාකරණානුකූල වෙනස්වීම් සහ යථානිය යෙදුම් ඇතුළුව, "වධදීම්" යන්නෙන් වෙනත් යම් තැනැත්තකුට දැඩි ශාරීරික හෝ මානසික වේදනා ගෙන දෙන්නා වූද,

(අ) පහත දැක්වෙන කාර්යයන් සඳහා

එනම් :-

(i) එකී වෙනත් තැනැත්තාගෙන් හෝ තුන්වන තැනැත්තකුගෙන් යම් තොරතුරක් හෝ පාපොච්චාරණයක් ලබා ගැනීම හෝ

(ii) එකී වෙනත් තැනැත්තා හෝ තුන්වන තැනැත්තකු විසින් කරන ලද හෝ කරන ලදැයි සැක කෙරෙන යම් ක්‍රියාවක් සඳහා ඒ තැනැත්තාට දඬුවම් කිරීම.

(iii) එකී වෙනත් තැනැත්තා හෝ තුන්වන තැනැත්තකු බිය ගැන්වීම හෝ ඔහුට බල කිරීම සඳහා

(ආ) වෙනස් කිරීම මත පදනම් වූ හේතුවක් නිසා කරන්නා වූද,

යම අවස්ථාවකදීම රජයේ නිලධරයකු නිල තත්වයකින් කටයුතු කරන වෙනත් තැනැත්තකු විසින් හෝ එම නිලධරයාගේ හෝ තැනැත්තාගේ මුල් වීමෙන් හෝ කැමැත්ත ඇතිව හෝ එම නිලධරයාගේ හෝ තැනැත්තාගේ විරුද්ධ නොවීම මත කරන්නාවූද යම් ක්‍රියාවක් අදහස්වේ".

<u>වෙල්මුරුගේසු</u> එදිරිව <u>හිතිපති</u> - 1981(1) එෆ්. ආර්. ඩී. 180 පොතේ 197-198 පිටුවල වනසුන්දර විනිසුරු මෙසේ නිරීක්ෂණය කර ඇත.

"චෝදනා කරනු ලැබ ඇති සිද්ධිමය කරුණු ඔප්පු වී ඇද්ද යන්න තිරණය කිරීමේදී, පැමිණිලිකරු සිදුකර ඇති ක්‍රියාව හෝ ක්‍රියා කලාපය සිදු වී ඇති බවට සාධාරණ හා යුක්ති සහගත මිනිසකුගේ ආරක්ෂිත අභිමතය මගින් තිරණය කරන්නේ ද යන්න අධිකරණය විසින් අසනු ඇත. අධිකරණයට ඇත්ත වශයෙන්ම හෝ ප්‍රමාණවත් සැකයක් ඇත්නම්, එනම් එවැනි තිරණයකට එළඹිමෙන් සාධාරණ සහ යුක්ති සහගත මිනිසකු වලක්වන ප්‍රමාණයේ සැකයක් ඇත්නම්, චෝදනාව ඔප්පු කරනු ලැබ නොමැති බවට අධිකරණය විසින් තිරණය කරනු ඇත".වෙල්මුරුගේසුගේ නඩුවේ දී නියම කරන ලද මෙම පරීක්ෂණය විමලරත්න විනිසුරු විසින් <u>කපු ගි 'කියන</u> එරෙහි <u>හෙට්ටිආරච්චි</u> නඩුවේදී අදාළ කර ගන්නා ලදි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නඩු ද බලන්න :-

1. <u>චන්න පිරිස් සහ තවත් අය</u> එදිරිව <u>නිතිපති</u> - 1994(1) ශ්‍රී ලං.නි.වා.1
2. <u>හමිඩ්</u> එදිරිව <u>රණසිංහ සහ තවත් අය</u> - 1990(1) ශ්‍රී ලං.නි.වා. 104
3. <u>සුමනතිලක</u> එදිරිව <u>අර්නස්ට් පෙරේරා</u> - 1990(1) ශ්‍රී.ලං.නි.වා.318

සනාථ වීම සඳහා වූ අවශ්‍යතාවය

ශ්‍රේෂ්ඨාධිකරණයේ මුල් කාලයේ තීරණවලට අනුව පෙත්සම්කරුවකුට වධහිංසා කිරීම පිළිබඳ පැමිණිල්ලක් වෛද්‍ය සාක්ෂි මගින් සනාථ කරනු නොලබන්නේ නම්, පෙත්සම්කරුගේ එම පැමිණිල්ල අධිකරණය විසින් පිළිගැනීමට වැඩි ඉඩ ප්‍රස්ථාවක් නොමැත. පහත සඳහන් නඩු බලන්න.

1. නවසිවායම් එදිරිව ගුණවර්ධන - 1989 (1) ශ්‍රී.ලංකා නී.වා 394
2. සුදත් සිල්වා එදිරිව කොඩිතුවක්කු - 1987(2)ශ්‍රී.ලංකා.නී.වා129

මෙවැනි නඩුවකදී වෛද්‍ය සාක්ෂි ඉතා වැදගත් බවට සලකන ලදී. එසේ සලකන ලද්දේ තුවාල, 11 වන ව්‍යවස්ථාව අදාළ වන ස්වභාවයේ ඒවා ද යන්න සහ නඩුවේ අවස්ථානුගත කරුණු අනුව, සිද්ධිමය කරුණු පිළිබඳව පෙත්සම්කරුගේ කථාව ද නැතහොත් වගඋත්තරකරුගේ කතාව ද සත්‍ය කථාව යන කරුණු දෙකම තීරණය කිරීම සඳහා වැදගත් වන හෙයිනි. ශාරීරික වධහිංසා පිළිබඳ චෝදනා සනාථ කිරීම සඳහා වෛද්‍ය සාක්ෂි නොමැති අවස්ථාවන්හි දී, 11 වන ව්‍යවස්ථාව කඩකර ඇති බවට ඔප්පු වී නොමැති බවට ඇතැම් නඩුවලදී ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර ඇත. පහත සඳහන් නඩු බලන්න.

1. කපුගීකියන එදිරිව හෙට්ටිආරච්චි - 1984(2) ශ්‍රී.ලං.නී.වා. 153
2. නවසිවායම් එදිරිව ගුණවර්ධන 1989(1)ශ්‍රී.ලං.නී.වා.394 පොතේ 401 වන පිටුව.

කෙසේ වුවද, පසුව පැවති නඩු වලදී, ශ්‍රේෂ්ඨාධිකරණය ඉහත සඳහන් මතයෙන් බැහැරව ගොස් ඇති අතර වෙනත් සාක්ෂි ඇත්නම්, වෛද්‍ය සාක්ෂි නොතිබීම වැදගත් නොවන බවට තීරණය කර ඇත.

මේ අනුව අනසලින් ප්‍රනාන්දු එදිරිව සරත් පෙරේරා සහ තවත් අය යන නඩුවේ දී 1992(1) ශ්‍රී.ලං.නී.වා. 411 පොතේ 419-420 පිටුවල කුලතුංග විනිසුරු මෙසේ සඳහන් කර ඇත. "ප්‍රබල සාක්ෂි වලින් සනාථ කරනු ලබන්නේ නම් මිස, පොලිසියට එරෙහිව පහරදීමේ/හිරිහැර කිරීමේ එක් එක් යන සෑම චෝදනාවක් ම මා විසින්

පිළිගනු නොලබන නමුත්, පොලිසිය විසින් ප්‍රතික්ෂේප කිරීම නිසාම පමණක් හෝ තුවාල පිළිබඳ වෛද්‍ය සාක්ෂි ඉදිරිපත් කිරීමට අභියාචනයට පත් පාර්ශවයට නොහැකිවීම නිසා එවැනි ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීම සිදුයුතු යයි මම නොසිතමි".

මේ නිසා දැනට, 11 වන ව්‍යවස්ථාව කඩ කිරීම පිළිබඳ චෝදනා වලට ස්ථිර භාවය පිළිබඳව උසස් මට්ටමක් අවශ්‍ය වන බව උපකල්පනය කිරීම ආරක්ෂා සහගත වන අතර යුක්තිය පසිඳලීම සඳහා ඇති ප්‍රවේශය ගින කරමින් අධිකරණය විසින් පෙත්සම්කරු මත අනවශ්‍ය බරක් පටවනු නොලැබේ. පහත සඳහන් නඩු බලන්න :-

1. <u>සුමනතිලක</u> එදිරිව <u>අර්නස්ට් පෙරේරා</u> - 1990(1)ශ්‍රී.ලං.නි.වා.318
2. <u>මලින්ද චන්න පිරිස් සහ තවත් අය</u> එරෙහිව <u>නීතිපති</u> 1994(1) ශ්‍රී.ලං.නි.වා.1

වධහිංසා ආදියට භාජන වූ පැනැත්තන්ට වන්දි මුදල්

11 වන ව්‍යවස්ථාව මගින් ආරක්ෂා කර ඇති ස්වකීය අයිතිවාසිකම් කඩකිරීම සම්බන්ධයෙන් පෙත්සම්කරුවන් විසින් ගොනුකර ඇති නඩු කීපයක දී මෙම වධ හිංසා වලට ගොදුරු වූවන්ට වැරදි සිදු කළ අය විසින් පෞද්ගලිකව වන්දි ගෙවිය යුතු බවට ආඥා කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දඬුවමක් ලෙස ක්‍රියා කරනු ඇති ඇති බවට විශ්වාස කරමිනි. නමුත් මේ මගින් මේ ප්‍රශ්නය පිළිබඳව ප්‍රබල බලපෑමක් සිදු වූ බවට පෙනෙන්නට නැත. මේ සම්බන්ධයෙන් අධිකරණයට ඇති කලකිරීම පිළිබඳව <u>රත්නපාල</u> එදිරිව <u>ධර්මසිරි</u> 1993(1) ශ්‍රී.ලං.නි.වා. 224 දරන නඩුවේ දී ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති අතර කුලතුංග ජ්. විසින් පහත දැක්වෙන පරිදි නිරීක්ෂණය කර ඇත.

"මෙයේ හෙයින් නඩු තීන්දු රාශියක් නොතකා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් සහතික කොට ඇති මූලික අයිතිවාසිකම් කඩ කරමින් පොලිස් ස්ථානවලදී, සිදු කරනු ලබන වධ හිංසා බාධාවකින් තොරව දිගටම සිදු කරගෙන යනු ලබන බව මට පෙනේ. සහන ලබා දීමේදී මෙම තත්වය පිළිබඳව මේ අධිකරණය සැලකිල්ලට ගැනීම අවශ්‍ය වේ.

එසේම ජයසේකර එදිරිව රාමනායක සහ තවත් අය - එස්.සී.එෆ්.ආර්.117/94 එස්.සී.එම්. 28/101994 යන නඩුවේ දී ධීරරත්න වි. විසින් මෙසේ සඳහන් කර ඇත.

"මෙම නීතියේ ආරක්ෂකයන් පිළිබඳව මේ අධිකරණය විසින් ඇතැම් අවස්ථාවල ප්‍රකාශ කරනු ලැබූ අදහස් නොතකා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ගෞරව බහුමානයෙන් යුක්තව සහතික වී ඇති පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් කෙරෙහි ඇතැම් පොලිස් නිලධාරයන් විසින් විටින් විට දක්වනු ලබන නොසැලකිල්ල පිළිබඳව මේ නඩුවේ සිද්ධිමය කරුණු වලින් පෙන්නුම් කරයි".

අවසාන වශයෙන් අබසින් ප්‍රනාන්දු එදිරිව එස්. අයි. ගුණරත්න සහ තවත් අය එස්. සී. 109/95 එස්. සී. එම්. 3/4/95 දරන නඩුවේ දී කුලතුංග වි. විසින් කරන ලද නිරීක්ෂණ පිළිබඳව සඳහන් කිරීම උචිත වේ.

"ක්‍රියා කලාපයේ පිළිකුල් සහගත භාවය පෙන්වීම සඳහා වන්දි මුදල් ගෙවීම උචිත බවත්, අධිකරණය විසින් සාධාරණ හා යුක්ති සහගත යයි සලකනු ලබන පැමිණිලිකරුට අයවිය යුතු වන්දි මුදලින් කොටසක්, නිතර නිතර නීතිය කඩකරන්නකු වන වගඋත්තරකරු විසින් ගෙවිය යුතු බවට ආඥා කිරීම උචිත බව මම ප්‍රකාශ කරමි. මන්නිසාද යත්, පලුදු වී ඇති පෙත්සම්කරුගේ සිත සනසා ගැනීමට එමගින් උපකාරී වන බැවිනි" මූලික අයිතිවාසිකම් කඩ කිරීම නැවත නැවත සිදු වීම වැළැක්වීම සඳහා රජයට එරෙහිව ප්‍රදානය කරනු ලබන වන්දි මුදලින් කොටසක් පෞද්ගලිකව ගෙවිය යුතු බවට 11 වන ව්‍යවස්ථාව කඩ කරන තැනැත්තන්ට නියම කිරීම ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පනවනු ලබන දණ්ඩන නොතකා කඩකිරීම් සිදු වන බව ඇත්ත වශයෙන්ම කණගාටුවට කරුණක් මෙන්ම යථාර්ථයකි. වගඋත්තරකරුවකු විසින් ඔහුගෙ ආදායම සැලකිල්ලට ගත යුතු බවට වූ මූලික ප්‍රතිපත්තිය දැන් පිළිගෙන ඇති බැවින් ඒ කරුණු සැලකිල්ලට ගැනීමේදී, වගඋත්තරකරුවකු විසින් ගෙවනු ලැබියයුතු බවට නියම කරනු ලබන මුදල, අනාගතයේ දී මූලික අයිතිවාසිකම් කඩ කරන්නන්ට පනවනු ලබන දඬුවමක් ලෙස බලපෑමට ප්‍රමාණවත් නොවිය හැකිය.

# පරිච්ඡේදය - 02

## වධහිංසා වලට සහ වෙනත් කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැළකිලිවලට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය.

(1984 දෙසැම්බර් මස 10 වන දින අංක 39/46 දරන එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ යෝජනා සම්මතය මගින් සම්මත කරගෙන, අත්සන් කිරීම, සපට කිරීම සහ පිළිගැනීම සඳහා අදාල කරගනිමින් විවෘතව තබන ලදී.]

බලාත්මක වීම : 27(1) වන ව්‍යවස්ථාවට අනුකූලව 1987 ජුනි මස 26 වන දින.

**මෙම සම්මුතියට පාර්ශවකරුවන් වන රාජ්‍යයන් විසින් -**

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය මගින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රතිපත්තිවලට අනුකූලව මිනිස් පවුලක සියලුම සාමාජිකයන්ගේ සමාන සහ අන්සතු කළ නොහැකි අයිතිවාසිකම් පිළිගැනීම, නිදහස, යුක්තිය සහ ලෝක සාමය යන කරුණුවල පදනම වන බව සැළකිල්ලට ගනිමින් ද; එම අයිතිවාසිකම්, මනුෂ්‍යයෙකුට ආවේනික ගරුත්වයෙන් පැන නඟින බවට පිළිගනිමින්ද,

මානව අයිතිවාසිකම් හා මූලික නිදහස සඳහා වූ විශ්ව ගරුත්වය ප්‍රවර්ධනය කිරීම සහ එම අයිතිවාසිකම් සහ නිදහසට අනුකූලව ක්‍රියා කිරීම සඳහා, ප්‍රඥප්තිය යටතේ සහ විශේෂයෙන්ම 55 වන ව්‍යවස්ථාව යටතේ රාජ්‍යවලට ඇති වගකීම සැළකිල්ලට ගනිමින් ද, කිසිම තැනැත්තකු වධහිංසාවලට යන වෙනත් කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැළකිලිවලට හෝ දඬුවම්වලට යටත් නොකළ යුතු බවට සළස්වන මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 5 වන ව්‍යවස්ථාව සහ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 7 වන ව්‍යවස්ථාව සැලකිල්ලට ගනිමින් ද, 1975 දෙසැම්බර් මස 9 වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ වධහිංසාවලට යන වෙනත් කෲර, අමානුෂික සහ අවමන් සහගත සැළකිලිවලට භාජනය කරනු ලැබීම එරෙහි සියලු තැනැත්තන්ට ආරක්ෂා කිරීම පිළිබඳ ප්‍රකාශනය ද සැලකිල්ලට ගනිමින් ද,

ලොව පුරා වධහිංසා සහ වෙනත් කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැළකිලිවලට හෝ දඬුවම් වලට එරෙහි වූ අරගලය වඩාත් ඵලදායි කිරීමේ අදහස ඇතිව පහත දැක්වෙන පරිදි එකඟ වී ඇත.

## 1 වන කොටස

### 1 වන ව්‍යවස්ථාව

1. මේ සම්මුතියේ කාර්ය සඳහා, 'වධහිංසාව' යන යෙදුමෙන් යම් තැනැත්තෙකුගෙන් හෝ තුන්වන පාර්ශවයකින් තොරතුරු හෝ පාපොච්චාරණයක් ලබා ගැනීම, යම් තැනැත්තකු හෝ තුන්වන පාර්ශවයක් විසින් සිදු කරන ලද හෝ සිදු කරන ලදැයි සැක කරනු ලබන යම් ක්‍රියාවක් සඳහා එම තැනැත්තාට දඬුවම් කිරීම, යම් ආකාරයක වෙනස්කම් දැක්වීමක් මත පදනම් වූ හේතුවක් නිසා ඔහුට හෝ තුන්වන පාර්ශවයකට තර්ජනය හෝ බලහත්කාරකම් වැනි ක්‍රියා මගින් ශාරීරික හෝ මානසික වශයෙන් තදබල වේදනාකාරි හෝ හිංසාකාරී ක්‍රියාවක්, රාජ්‍ය නිලධරයකු හෝ නිල තත්වයෙන් ක්‍රියා කරන වෙනත් තැනැත්තකු හෝ එවැනි නිලධරයකුගේ හෝ වෙනත් තැනැත්තකුගේ ඉල්ලීම පිට හෝ කැමැත්ත ඇතිව හෝ අනුදැනුම ඇතිව එම තැනැත්තා වෙත සිදු කරනු ලබන විට, එම ක්‍රියාව අදහස් වේ. නීත්‍යානුකූල දණ්ඩනවලින් පැන නගින හෝ එවැනි දණ්ඩනවලට ආවේණික හෝ ආනුෂංගික වන වේදනාවක් හෝ හිංසාකාරී ක්‍රියාවක් ඊට ඇතුළත් නොවේ.

2. පුළුල් අදාළ කරගැනීමක් සඳහා වූ විධිවිධාන ඇතුළත් යම් ජාත්‍යන්තර සාධක පත්‍රයකට හෝ ජාතික ප්‍රඥප්තියකට මේ ව්‍යවස්ථාවෙන් බලපෑමක් සිදු නොවේ.

### 2 වන ව්‍යවස්ථාව

1. පාර්ශවකරුවකු වන එක් එක් රාජ්‍යය විසින්, ස්වකීය අධිකරණ බලය යටතේ ඇති යම් ප්‍රදේශයක් තුළ වධ හිංසා ක්‍රියා වැළැක්වීම

සඳහා එම රාජ්‍යය විසින් ව්‍යවස්ථාදායක, පරිපාලනමය, අධිකරණ හෝ වෙනත් පියවර ගත යුතුය.

2. වධහිංසා සාධාරණීකරණය කිරීම සඳහා, යුධ තත්වයක් හෝ යුධ තර්ජනයක්, අභ්‍යන්තර දේශපාලන අස්ථිරභාවයක් හෝ වෙනත් මහජන හදිසි අවස්ථාවක් වැනි කිසිදු විශේෂ අවස්ථානුගත කරුණක පිහිට පැතිය නොහැකිය.

3. වධහිංසාවක් සාධාරණීකරණය කිරීම සඳහා, ඉහළ නිලධරයකුගේ හෝ රාජ්‍ය නිලධරයකුගේ නියමයක පිහිට පැතිය නොහැකිය.

## 3 වන ව්‍යවස්ථාව

1. කිසිම රාජ්‍ය පාර්ශවයක් විසින්, යම් තැනැත්තකු වධහිංසාවලට භාජනය වීමට ඉඩ ඇති බවට විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතු ඇති වෙනත් රාජ්‍යයක් වෙත එම තැනැත්තා පිටමං කිරීම, ආපසු යැවීම හෝ උදර්පණය කිරීම නොකළ යුතුය.

2. එවැනි හේතු ඇද්ද යන්න තීරණය කිරීමේ කාර්ය සඳහා, අදාළ රාජ්‍ය තුළ බරපතල ලෙස, දරුණු ලෙස හෝ විශාල ලෙස මානව හිමිකම් උල්ලංඝනය කිරීම් එකදිගට සිදුවීමේ ප්‍රවණතාවක් ඇද්ද යන්න ඇතුළු අදාළ සියලු සලකා බැලිම් නිසි බලධරයා විසින් සැලකිල්ලට ගත යුතුය.

## 4 වන ව්‍යවස්ථාව

1. සියලු වධහිංසා ක්‍රියා එක් එක් පාර්ශව රාජ්‍යයේ අපරාධ නීතිය යටතේ වැරදි බවට පත් කිරීමට එම රාජ්‍යයන් වගබලාගත යුතුය. වධහිංසා සිදු කිරීමට උත්සාහ කිරීම සහ වධහිංසා කිරීමට හවුල්වීම හෝ සහභාගිවීම සංයුක්ත වන යම් ක්‍රියාවක් යම් තැනැත්තකු විසින් සිදු කිරීම සම්බන්ධයෙන්ද, ඉහත සඳහන් කරුණ අදාළ විය යුතුය.

2. මෙම වැරදිවල බරපතල ස්වභාවය සැළකිල්ලට ගෙන, පාර්ශවකරුවන් වන එක් එක් රාජ්‍ය විසින් මෙම වැරදි සඳහා උචිත දඬුවම් ලබා දිය යුතුය.

## 5 වන ව්‍යවස්ථාව

1. පහත දැක්වෙන අවස්ථාවලදී 4 වන ව්‍යවස්ථාවේ සඳහන් වැරදි සම්බන්ධයෙන් ස්වකීය අධිකරණ බලය ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය පියවර පාර්ශවකරුවන් වන එක් එක් රාජ්‍යය විසින් ගත යුතුය.

   (අ) ස්වකීය අධිකරණ බලය යටතේ ඇති යම් ප්‍රදේශයකදී, එම රාජ්‍යයේ ලියාපදිංචි කර ඇති නැවක් හෝ ගුවන් යානයක් තුළදී, වැරදි සිදු කරනු ලැබූ විට.

   (ආ) වරද සිදු කළ බවට චෝදනා ලැබ සිටින වැරදිකරු එම රාජ්‍යයේ පුරවැසියකු වන විට.

   (ඇ) උචිත යයි එම රාජ්‍යය විසින් සලකනු ලබන්නේ නම්, වරදට භාජන වූ තැනැත්තා එම රාජ්‍යයේ පුරවැසියකු වන විට.

2. වරද සිදු කළ බවට චෝදනා ලැබ සිටින වරදකරු, පාර්ශවකරුවන් වන යම් රාජ්‍යයක අධිකරණ බලය යටතේ ඇති යම් ප්‍රදේශයක සිටින විට සහ එම රාජ්‍යය විසින් 8 වන ව්‍යවස්ථා ව ප්‍රකාරව එම තැනැත්තා මෙම ව්‍යවස්ථාවේ 1 වන ඡේදයේ සඳහන් යම් රටකට උදර්පණය කරනු නොලබන විට, එවැනි වැරදි සම්බන්ධයෙන් ස්වකීය අධිකරණ බලය ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය පියවර පාර්ශවකරුවන් වන එක් එක් රාජ්‍යය විසින් ගත යුතුය.

3. අභ්‍යන්තර නීතියකට අනුකූලව ක්‍රියාත්මක කරනු ලබන යම් අපරාධ අධිකරණ බලයක් මේ සම්මුතිය මගින් බැහැර කරනු නොලැබේ.

## 6 වන ව්‍යවස්ථාව

1. 4 වන ව්‍යවස්ථාවේ සඳහන් යම් වරදක් සිදුකර ඇතැයි කියනු ලබන යම් තැනැත්තෙක් සිටින්නේ පාර්ශව කරුවකු වන යම් රාජ්‍යයක බලසීමාව තුළද, එම රාජ්‍යය විසින්, අවස්ථානුගත කරුණු අනුව අවශ්‍ය වන්නේ නම්, එම රාජ්‍යය වෙත ලැබී ඇති තොරතුරු පරීක්ෂා කිරීමකින් පසු, සෑහීමට පත්වීමේදී, ඔහු අත්අඩංගුවට ගැනීම හෝ ඔහු සිටින බවට සහතික වීම පිණිස වෙනත් නෛතික පියවර හෝ ගත යුතුය. අත් අඩංගුවට ගැනීම හෝ වෙනත් නෛතික පියවර එම රාජ්‍යයේ නීතිය මගින් විධි විධාන සලසා ඇති පරිදි විය යුතු නමුත් එම අත් අඩංගුවේ තබා ගැනීම හෝ නෛතික පියවර දිගටම පවත්වාගෙන යා යුත්තේ යම් අපරාධ හෝ උද්ර්පන නඩු කටයුතු පැවරීම සඳහා අවශ්‍ය වන කාලය දක්වා පමණි.

2. එම රාජ්‍යය විසින්, වහාම සිද්ධිමය කරුණු පිළිබඳ මූලික පරීක්ෂණයක් පැවැත්විය යුතුය.

3. මේ ව්‍යවස්ථාවේ 1 වන ඡේදය ප්‍රකාරව අත් අඩංගුවට ගනු ලැබූ යම් තැනැත්තකුට, ඔහු පුරවැසියකු වන රාජ්‍යයේ ළඟම සිටින උචිත නියෝජිතයා සමග හෝ ඔහු පුරවැසිභාවයක් නොමැති තැනැත්තකු නම්, ඔහු සාමාන්‍යයෙන් පදිංචිව සිටින රාජ්‍යයේ නියෝජිතයා සමග සංනිවේදනය කිරීම සඳහා වහාම ආධාර කරනු ලැබිය යුතුය.

4. යම් රාජ්‍යයක් විසින්, මේ ව්‍යවස්ථාව ප්‍රකාරව, යම් තැනැත්තකු අත්අඩංගුවට ගනු ලැබූ අවස්ථාවක, ඔහු අත්අඩංගුවට ගත් බව සහ ඔහු අත්අඩංගුවට ගැනීමට හේතු සාධක වූ අවස්ථානුගත කරුණු පිළිබඳව, එම රාජ්‍යය විසින් වහාම, 5 වන ව්‍යවස්ථාවේ 1 වන ඡේදයේ සඳහන් රාජ්‍යයන් වෙත දැනුම් දිය යුතුය. මේ ව්‍යවස්ථාවේ 2 වන ඡේදයේ සඳහන් මූලික පරීක්ෂණය පවත්වන රාජ්‍යය විසින්, ස්වකීය සොයාගැනීම් පිළිබඳව එකී රාජ්‍යය වෙත වහාම වාර්තා කළ යුතු අතර අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමට එම රාජ්‍යය අදහස් කරන්නේ ද, යන්න ද, සඳහන් කළ යුතුය.

## 7 වන ව්‍යවස්ථාව

1. 4 වන ව්‍යවස්ථාවේ සඳහන් යම් වරදක් සිදු කරන ලද,යි කියනු ලබන යම් තැනැත්තෙක් සොයාගනු ලබන්නේ යම් පාර්ශව රාජ්‍යයක අධිකරණ බලය යටතේ ඇති ප්‍රදේශයක් තුළදී ද, එම රාජ්‍යය විසින්, 5 වන ව්‍යවස්ථාවේ සඳහන් අවස්ථාවලදී එම තැනැත්තා උද්දර්පනය නොකරන්නේ නම්, නඩු පැවරීමේ කාර්යය සඳහා, එම සිද්ධිමය කරුණ ස්වකීය නිසි බලධරයන් වෙත යොමු කරනු ලැබිය යුතුය.

2. එම නිසි බලධරයන් විසින්, එම රාජ්‍යයේ නීතිය යටතේ, බරපතල ස්වභාවයේ යම් සාමාන්‍ය වරදක් සම්බන්ධයෙන් තීරණය කරන අකාරයටම, ඔවුන්ගේ තීරණය ගත යුතුය. 5 වන ව්‍යවස්ථා වේ 2 වන ඡේදයේ සඳහන් කරුණු වලදී, නඩු පැවරීම සහ වරදකරු කිරීම සඳහා අවශ්‍ය සාක්ෂිවල ප්‍රමිතිය 5 වන ව්‍යවස්ථාවේ 1 වන ඡේදයේ සඳහන් කරුණු වලට අදාළ සාක්ෂි පිළිබඳ ප්‍රමිතිවලට වඩා කිසිදු ආකාරයකින් තදබල කමින් අඩු නොවිය යුතුය.

3. 4 වන ව්‍යවස්ථාවේ සඳහන් වැරදිවලින් යම් වරදක් සම්බන්ධයෙන් නීති කෘත්‍යයක් පවරා ඇත්තේ යම් තැනැත්තෙකු සම්බන්ධයෙන් ද, එම තැනැත්තා සම්බන්ධයෙන් එම නීති කෘත්‍යයන් සියලු අදියරවලදී, යාධාරණ ලෙස ක්‍රියා කරන බවට සහතික විය යුතුය.

## 8 වන ව්‍යවස්ථාව

1. 4 වන ව්‍යවස්ථාවේ සඳහන් වැරදි, පාර්ශව රාජ්‍යයන් අතර පවතින යම් උද්දර්පන ගිවිසුමක උද්දර්පනය කලහැකි වැරදි ලෙස ඇතුළත් කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතුය. පාර්ශව රාජ්‍යයන් අතර ඇති කර ගනු ලබන සෑම උද්දර්පන ගිවිසුමකම එම වැරදි උද්දර්පනය කලහැකි වැරදි ලෙස ඇතුළත් කිරීමට පාර්ශව රාජ්‍යයන් එකඟ වේ.

2. උද්ර්පණය සඳහා ගිවිසුමක් තිබිය යුතු බවට කොන්දේසියක් සාදා ඇති යම් පාර්ශව රාජ්‍යයන් සමග උද්ර්පන ගිවිසුමක් නොමැති වෙනත් පාර්ශව රාජ්‍යයකින්, පළමු සඳහන් රාජ්‍යය වෙත උද්ර්පනය සඳහා ඉල්ලීමක් ලැබුනු විට, එම වරද සම්බන්ධයෙන් උද්ර්පනය කිරීම සඳහා මෙම සම්මුතිය නෛතික පදනමක් ලෙස එම රාජ්‍යය විසින් සලකනු ලැබිය යුතුය. උද්ර්පණය සිදු කළ යුත්තේ ඉල්ලා සිටින රාජ්‍යයේ නීතිය මගින් විධිවිධාන සළසා ඇති වෙනත් කොන්දේසිවලට යටත්වය.

3. උද්ර්පණය කිරීම සඳහා ගිවිසුමක් තිබිය යුතු බවට කොන්දේසියක් ඉදිරිපත් නොකරන පාර්ශව රාජ්‍යයන් විසින්, ඉල්ලා සිටින රාජ්‍යයේ නීතිය මගින් විධිවිධාන සළසා ඇති වෙනත් කොන්දේසි වලට යටත්ව, එම වැරදි, උද්ර්පනය කළහැකි වැරදි ලෙස පිළිගත යුතුය.

4. පාර්ශව රාජ්‍යයන් අතර උද්ර්පනය කිරීමේ කාර්යය සඳහා, එම වැරදි, සිදු වූ ස්ථානයේදී සිදු කළ වැරදි ලෙස පමණක් නොව 5 වන ව්‍යවස්ථාවේ 1 වන ඡේදයට අනුකූලව අධිකරණ බලය ස්ථාපිත කිරීම සඳහා නියමිත රාජ්‍යවල භූමි ප්‍රදේශය තුළදී සිදු කරන ලද වැරදි ලෙය සලකනු ලැබිය යුතුය.

## 9 වන ව්‍යවස්ථාව

1. නීති කෘත්‍යය සඳහා අවශ්‍ය වූද, පාර්ශව රාජ්‍යයන් වෙත ඇති වූද සියලු සාක්ෂි සැපයීම ඇතුළු, 4 වන ව්‍යවස්ථාවේ සඳහන් වැරදිවලින් යම් වරදක් සම්බන්ධයෙන් පවරන ලද අපරාධ නඩු කටයුතු සම්බන්ධයෙන් පාර්ශව රාජ්‍යයන් විසින් ඉතා ඉහළ මට්ටමේ සහනයක් එම රාජ්‍යයන් අතර ලබා දිය යුතුය.

2. පාර්ශව රාජ්‍යයන් අතර තිබිය හැකි අන්‍යෝන්‍ය අධිකරණමය සහාය පිළිබඳ යම් ගිවිසුමකට අනුකූලව මේ ව්‍යවස්ථාවේ 1 වන ඡේදය යටතේ පාර්ශව රාජ්‍යයන් විසින් ස්වකීය වගකීම ඉටු කළ යුතුය.

## 10 වන ව්‍යවස්ථාව

1. යම් ආකාරයක සිරභාරයට ගැනීම, රඳවා තබා ගැනීම හෝ බන්ධනාගාර ගත කිරීමකට යටත්වන යම් පුද්ගලයකු අත් අඩංගුවට ගැනීමේ ප්‍රශ්න කිරීමේ හෝ ඔහුට ප්‍රතිකාර කිරීමේ නියැලී සිටින නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධරයන්, සිවිල් හෝ යුධ නිලධරයන්, වෛද්‍ය නිලධරයන්, රජයේ නිලධරයන් සහ වෙනත් තැනැත්තන් පුහුණු කිරීමේදී, වධහිංසාවලට එරෙහි තහනම සම්බන්ධයෙන් වූ අධ්‍යාපනය යහ තොරතුරු සම්පූර්ණයෙන් ඇතුලත් කරනු ලබන බවට එක් එක් පාර්ශව රාජ්‍යය වගබලා ගත යුතුය.

2. එක් එක් පාර්ශව රාජ්‍යය විසින් එවැනි යම් තැනැත්තකුගේ කාර්ය සහ කර්තව්‍ය සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන රීති සහ උපදෙස්වල මෙම තහනමද ඇතුළත් කරනු ලැබිය යුතුය.

## 11 වන ව්‍යවස්ථාව

යම් වධහිංසා සිදුවීම වැළැක්වීමේ අදහසින්, එක් එක් පාර්ශව රාජ්‍යය විසින් ස්වකීය අධිකරණ බලය යටතේ ඇති යම් රාජ්‍යයකදී යම් ආකාරයක සිරභාරයට ගැනීම, රඳවා තබාගැනීම හෝ බන්ධනාගාරගත කිරීමකට යටත් වන තැනැත්තන්ගෙන් ප්‍රශ්න කිරීමේ රීති, උපදෙස්, ක්‍රම විධි සහ පරිචය මෙන්ම එම තැනැත්තන්ගේ භාරය සහ ඔවුන්ට ප්‍රතිකාර කිරීම සඳහා වූ වැඩ පිළිවෙල ද එක් එක් පාර්ශවය විසින් ක්‍රමානුකූලව ප්‍රතිශෝධනය කරනු ලැබිය යුතුය.

## 12 වන ව්‍යවස්ථාව

එක් එක් පාර්ශව රාජ්‍යයේ අධිකරණ බලසීමාව තුළ යම් ප්‍රදේශයකදී යම් වධහිංසා ක්‍රියාවක් සිදු කර ඇති බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති අවස්ථාවක, ස්වකීය නිසි බලධරයන් කඩිනම් සහ අපක්ෂපාත පරීක්ෂණයක් පවත්වන බවට එක් එක් පාර්ශව රාජ්‍යය වගබලා ගත යුතුය.

## 13 වන ව්‍යවස්ථාව

එක් එක් පාර්ශව රාජ්‍යයේ අධිකරණ බල සීමාව යටතේ ඇති යම් ප්‍රදේශයකදී, තමා වධහිංසාවලට භාජන වූ බවට චෝදනා කරනු ලබන යම් පුද්ගලයකුට නිසි බලධරයා වෙත පැමිණිලිකිරීමට බලයක් ඇති බවට ද, තමාගේ නඩුව නිසි බලධරයා විසින් කඩිනමින් සහ අපක්ෂපාත ලෙස විභාග කරන බවටද, එම පාර්ශව රාජ්‍යය වගබලාගත යුතුය. තම පැමිණිල්ලේ හෝ දෙන ලද සාක්ෂිවල ප්‍රතිඵලයක් වශයෙන් දෙන ලද, සාක්ෂිකරුවන්ට වෙනස්කම් දැක්වීමට හෝ තර්ජනය කිරීමට එරෙහිව ඔවුන් ආරක්ෂා කරන බවට වගබලා ගැනීම සඳහා පියවර ගනු ලැබිය යුතුය.

## 14 වන ව්‍යවස්ථාව

1. වධහිංසා ක්‍රියාවකට භාජන වූ තැනැත්තකුට හැකිතාක් දුරට සම්පූර්ණ පුනරුත්ථාපනය සඳහා වූ ක්‍රම ඇතුළු සහන ලැබෙන බවටද, සාධාරණ හා ප්‍රමාණවත් වන්දි ලබාගැනීම සඳහා නඩු පැවරීමේ අයිතියක් ඇති බවට ද, එක් එක් පාර්ශව රාජ්‍යය විසින් ස්වකීය නීති පද්ධතියෙහි ඇතුළත් කරන බවට එම රාජ්‍ය වගබලා ගත යුතුය. යම් වධහිංසා ක්‍රියාවක ප්‍රතිඵලයක් වශයෙන් එයට ගොදුරු වූ තැනැත්තකු මියගිය අවස්ථාවක, ඔහුගෙන් යැපෙන්නන්ට වන්දි ලබාගැනීම සඳහා හිමිකම් ඇත.

2. වධහිංසාවලට ගොදුරු වූ තැනැත්තකු වන්දි ලබාගැනීම සඳහා ජාතික නීතිය යටතේ ඇති යම් අයිතිවාසිකමකට මේ ව්‍යවස්ථාවේ ඇති කිසිවකින් බලපෑමක් සිදු නොවිය යුතු ය.

## 15. වන ව්‍යවස්ථාව

වධහිංසාවල ප්‍රතිඵලයක් වශයෙන් කරනු ලැබ ඇති බවට ඔප්පු කර ඇති යම් ප්‍රකාශයක්, එම ප්‍රකාශය කරනු ලැබූ බවට සාක්ෂි වශයෙන් වධහිංසාවලට චෝදනා ලැබ සිටින තැනැත්තාට එරෙහි හැර, යම් නඩු කටයුත්තක දී සාක්ෂියක් වශයෙන් ආවේශ කර ගනු නොලැබිය යුතුය.

## 16 වන ව්‍යවස්ථාව

1. 1 වන ව්‍යවස්ථාවේ අර්ථ නිරූපණය කර ඇති වධහිංසාවලට අයත් නොවන යම් කෲර, අමානුෂික හෝ අවමන් සහගත ක්‍රියාවක් හෝ දඬුවමක් රජයේ නිලධරයකු විසින් හෝ නිල තත්වයෙන් ක්‍රියා කරන වෙනත් තැනැත්තකු විසින් නැතහොත් එම නිලධාරීන්ගේ හෝ තැනැත්තන්ගේ ඉල්ලීම මත හෝ ඔවුන්ගේ කැමැත්ත හෝ එකඟත්වය ඇතිව ස්වකීය අධිකරණ බලය යටතේ ඇති යම් ප්‍රදේශයක් තුළදී සිදු කිරීම වැළැක්වීම සඳහා එක් එක් පාර්ශව රාජ්‍ය වගබලාගත යුතුය. විශේෂයෙන්ම 10,11,12 සහ 13 වන ව්‍යවස්ථාවල අඩංගු වගකීම්, එම ව්‍යවස්ථාවල ඇති වධහිංසාවලට කරන ලද සඳහන් කිරීම් වෙනුවට කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිලි හෝ දඬුවම් වලට කරනු ලබන සඳහන් කිරීම් ලෙස ආදේශ කිරීමෙන් පසු එම වගකීම් එම ව්‍යවස්ථාවලට අදාළ විය යුතුය.

2. මේ සම්මුතියේ විධිවිධාන, කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිලි හෝ දඬුවම් තහනම් කරන හෝ උදර්පනය කිරීමට හෝ නෙරපීමට අදාළව, වෙනත් යම් ජාත්‍යන්තර සාධන පත්‍රයක හෝ ජාතික නීතියක අන්තර්ගත විධිවිධානවලට මේ සම්මුතියේ විධිවිධානවලින් හානියක් සිදුනොවේ.

## 2 වන කොටස

## 17 වන ව්‍යවස්ථාව

1. (මෙහි මින්මතු 'කමිටුව' යනුවෙන් සඳහන් කරනු ලබන) වධහිංසා වලට එරෙහිව වූ කමිටුවක් පිහිටුවනු ලැබිය යුතු අතර එම කමිටුව විසින් මෙහි මින්පසු විධිවිධාන සලසා ඇති කර්තව්‍ය ඉටුකරනු ලැබිය යුතුය. කමිටුව, උසස් චරිතයකින් යුත් සහ මානව හිමිකම් ක්ෂේත්‍රයේ පිළිගත් ප්‍රවීණතාවක් ඇති විශේෂඥයන් දස දෙනකුගෙන් සමන්විත විය යුතු අතර, එම තැනැත්තන්

ඔවුන්ගේ පෞද්ගලික තත්වයෙන් සේවය කළ යුතුය. භූගෝල විද්‍යාත්මකව සමාන ලෙස බෙදියාම සහ නෛතික පළපුරුද්ද ඇති තැනැත්තන් සහභාගී වීමේ ඇති ප්‍රයෝජනය සැලකිල්ලට ගෙන පාර්ශව රාජ්‍යයන් විසින් විශේෂඥයන් තෝරා පත් කරගත යුතුය.

2. කමිටුවේ සාමාජිකයන්, පාර්ශව රාජ්‍යයන් විසින් නම් කරනු ලබන තැනැත්තන්ගේ ලැයිස්තුවකින් රහස් ඡන්දයෙන් තෝරා පත් කරගත යුතුය. එක් එක් පාර්ශව රාජ්‍යය විසින්, ස්වකීය පුරවැසියන්ගෙන් එක් තැනැත්තකු නම් කරනු ලැබිය හැකිය. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය යටතේ පිහිටුවනු ලැබූ මානව හිමිකම් කමිටුවේ සාමාජිකයන් වන්නා වූද, වධහිංසාවලට එරෙහි ව වූ කමිටුවේ සේවය කිරීමට කැමැත්ත ඇත්තා වූද තැනැත්තන් නාම යෝජනා කිරීමේ ප්‍රයෝජනවත් භාවය පිළිබඳව පාර්ශව රාජ්‍යයන් සිත්හි තබාගත යුතුය.

3. වර්ෂ දෙකකට වරක් පවත්වනු ලබන්නා වූද එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා විසින් කැඳවනු ලබන පාර්ශව රාජ්‍යයන්ගේ රැස්වීමකදී කමිටුවේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම සිදු කළ යුතුය. මෙම රැස්වීම්වලදී ගණපූරණය පාර්ශව රාජ්‍යයන් තුනෙන් දෙකක් විය යුතු අතර කමිටුවට තෝරා පත් කර ගනු ලබන තැනැත්තන් විය යුත්තේ වැඩිම ඡන්ද ප්‍රමාණයක් ලබාගන්නා වූද පැමිණ ඡන්දය දෙන පාර්ශව රාජ්‍යයන්ගේ නියෝජිතයන්ගේ ඡන්දවලින් පරම බහුතරයක් ලබාගන්නා වූද තැනැත්තන්ය.

4. මූලික තෝරා පත් කර ගැනීම සිදු කළ යුත්තේ මේ සම්මුතිය ක්‍රියාත්මක වීමේ දින සිට මාස හයක් ගතවීමට පෙරය. එක් එක් තෝරා පත්කර ගැනීමේ දිනයට අවම වශයෙන් මාස හතරකට පෙර එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම්වරයා විසින් පාර්ශව රාජ්‍යයන් වෙත ලිපියක් යවමින්, මාස තුනක් ඇතුළත ස්වකීය නාමයෝජනා ඉදිරිපත් කරන ලෙස පාර්ශව රාජ්‍යයන්ට ආරාධනා කළ යුතුය එසේ නාමයෝජනා කරන ලද තැනැත්තන්ගේ නාම ලේඛණයක් මහ ලේකම්වරයා අකාරාදි පිළිවෙල අනුව සකස් කල යුතු අතර ඔවුන් නම් කළ රාජ්‍යයන්ද එහි සඳහන්

කළ යුතුය. තවද, එම නාම ලේඛනය පාර්ශව රාජ්‍යයන් වෙත යවනු ලැබිය යුතුය.

5. කමිටුවේ සාමාජිකයන් අවුරුදු හතරක කාලයක් සඳහා තෝරා පත් කර ගත යුතුය. ඔවුන්ගේ නම් නැවත නාමයෝජනා කරනු ලැබුවහොත්, ඔව්හු නැවත තෝරා පත්කර ගැනීම සඳහා සුදුස්සෝ වෙති. කෙසේ වුවද, පළමුවන තෝරා පත් කර ගැනීමේදී තෝරා පත්කර ගනු ලබන සාමාජිකයන් පස් දෙනෙකුගේ ධුර කාලය වර්ෂ දෙකක් අවසානයේදී අවසන් විය යුතුය. පළමුවන තෝරා පත් කර ගැනීමට ඉක්බිතිවම, මේ ව්‍යවස්ථාවේ 3 වන ඡේදයේ සඳහන් රැස්වීමේ සභාපතිවරයා විසින් ලොතරැයි ඇදීම මගින් සාමාජිකයන් පස්දෙනෙකුගේ නම් තෝරා ගත යුතුය.

6. කමිටුවේ සාමාජිකයෙකු මියගියහොත් හෝ ඉල්ලා අස්වුවහොත් නැතහොත් වෙන යම් හේතුවක් නිසා කමිටුවේ කාර්ය තවදුරටත් ඉටු කළ නොහැකි නම්, ඔහු නම් කළ පාර්ශව රාජ්‍ය විසින්, පාර්ශව රාජ්‍ය බහුතරයක අනුමැතියට යටත්ව, එම සාමාජිකයාගේ ඉතිරි ධුරකාල සඳහා සේවය කිරීමට තම පුරවැසියන් අතරින් වෙනත් විශේෂඥයකු පත් කරනු ලැබිය යුතුය. යෝජිත පත් කිරීම පිළිබඳව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම්වරයා විසින් දැනුම්දීමෙන් පසු සති හයක් ඇතුළත පාර්ශව රාජ්‍යයන්ගෙන් හරි අඩක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විරුද්ධව ප්‍රතිචාර දැක්වුවහොත් මිස, අනුමැතිය දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

7. කමිටුවේ සාමාජිකයන් විසින් කමිටුවේ කාර්ය ඉටුකරන විට, ඔවුන්ගේ වියදම් සඳහා පාර්ශව රාජ්‍යයන් වගකිව යුතුය.

## 18 වන ව්‍යවස්ථාව

1. කමිටුව විසින් ස්වකීය නිලධරයන් අවුරුදු දෙකක කාලයක් සඳහා තෝරා පත් කරගත යුතුය. ඔවුන් නැවත තෝරා පත් කර ගනු ලැබිය හැකිය.

2. කමිටුව විසින් කාර්ය පටිපාටිය පිළිබඳ ස්වකීය රීති සාදනු ලැබිය යුතුය. නමුත් මෙම රීති මගින්. වෙනත් කරුණු අතර පහත සඳහන් කරුණු සඳහා විධිවිධාන සැළැස්විය යුතුය :

(අ) ගණපූරණය සාමාජිකයන් හය දෙනෙකු විය යුතුය.

(ආ) කමිටුවේ තීරණ ගත යුත්තේ පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙනි.

3. මේ සම්මුතිය යටතේ කමිටුවේ කර්තව්‍ය ඵලදායි ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩල සහ පහසුකම් එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා විසින් සැපයිය යුතුය.

4. එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා විසින් කමිටුවේ ආරම්භක රැස්වීම කැඳවනු ලැබිය යුතුය. එහි ආරම්භක රැස්වීමෙන් පසු, කාර්ය පටිපාටිය පිළිබඳ කමිටුවේ රීතිවල විධිවිධාන සළසා ඇති කාලසීමාවන් වලදී කමිටුව රැස්විය යුතුය.

5. මේ ව්‍යවස්ථාවේ 3 වන ඡේදය ප්‍රකාරව එක්සත් ජාතීන්ට දැරීමට සිදු වූ කාර්ය මණ්ඩල සහ පහසුකම් පිළිබඳ වියදම් වැනි යම් වියදමක් සඳහා එක්සත් ජාතීන්ට උපදානය කිරීම ඇතුළු පාර්ශව රාජ්‍යවල සහ කමිටුවේ රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් දරන ලද වියදම් සඳහා පාර්ශව රාජ්‍යයන් වගකිව යුතුය.

## 19 වන ව්‍යවස්ථාව

1. අදාළ පාර්ශව රාජ්‍යයන් සඳහා සම්මුතිය බලාත්මක වීමෙන් පසු එක් අවුරුද්දක් ඇතුළත, මේ සම්මුතිය යටතේ භාරගත් වගකීම් ඉටුකිරීම සඳහා එම රාජ්‍යයන් විසින් ගෙන ඇති පියවර පිළිබඳ වාර්තා, පාර්ශව රාජ්‍යයන් විසින්, එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා හරහා, කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. ඉන්පසුව, පාර්ශව රාජ්‍යන් විසින් ගනු ලබන නව පියවර පිළිබඳව සෑම වසර හතරකටම වරක් පරිපූරක වාර්තා සහ කමිටුව විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි වෙනත් වාර්තා ඉදිරිපත් කළ යුතුය.

2. එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා විසින් සියලුම පාර්ශව රාජ්‍යය වෙත වාර්තා යැවිය යුතුය.

3. එක් එක් වාර්තාව කමිටුව විසින් සළකා බැලිය යුතු අතර එම වාර්තාව පිළිබඳව කමිටුව විසින් උචිත යයි සළකනු ලබන සාමාන්‍ය ගුණදොස් විවේචනයක් කරනු ලැබිය හැකිය. තවද කමිටුව විසින් එම වාර්තාව අදාළ පාර්ශව රාජ්‍යය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එම පාර්ශව රාජ්‍යය විසින් සුදුසුයයි තිරණය කරනු ලබන නිරීක්ෂණ, කමිටුව වෙත ඉදිරිපත් කිරීමෙන් ප්‍රතිචාර දැක්විය හැකිය.

4. මේ ව්‍යවස්ථාවේ 3 වන ඡේදයට අනුකූලව කමිටුව විසින්කරන ලද යම් ගුණදොස් විවේචනයන් සහ වාර්තාව පිළිබඳව අදාළ පාර්ශව රාජ්‍යයෙන් ලැබුන නිරීක්ෂණද, කමිටුව විසින්, ස්වකීය අභිමතය පරිදි 24 වන ව්‍යවස්ථාවට අනුකූලව සාදනු ලබන ස්වකීය වාර්ෂික වාර්තාවට ඇතුලත් කිරීමට කමිටුව විසින් තිරණය කරනු ලැබිය හැකිය.

## 20 වන ව්‍යවස්ථාව

1. පාර්ශව රාජ්‍යයක යම් ප්‍රදේශය තුළ වධහිංසාව ක්‍රමානුකූලව සිදු කරමින් පවතින බවට ස්ථිර වශයෙන් ඇඟවෙන බවට කමිටුවට පෙනී යන විශ්වාස කටයුතු තොරතුරු කමිටුවට ලැබෙන්නේ නම්, තොරතුරු පරීක්ෂා කිරීම සඳහා සහයෝගය ලබා දෙන ලෙසද මේ කාර්ය සඳහා අදාළ තොරතුරුවලට සම්බන්ධ නිරීක්ෂණ ඉදිරිපත් කරන ලෙසද කමිටුව විසින් පාර්ශව රාජ්‍යයට ආරාධනා කළ යුතුය.

2. අදාළ පාර්ශව රාජ්‍යය විසින් ඉදිරිපත් කර ඇති යම් නිරීක්ෂණ මෙන්ම කමිටුව වෙත ඇති වෙනත් යම් අදාළ තොරතුරු ද සැලකිල්ලට ගෙන, කමිටුව විසින් අවශ්‍ය යයි තිරණය කරනු ලබන්නේ නම්, රහසිගත පරීක්ෂණයක් පවත්වා ඉක්මණින් කමිටුව වෙත වාර්තා කිරීම සඳහා කමිටුවේ සාමාජිකයන් එක් අයකු හෝ ඊට වැඩි ප්‍රමාණයක් නම් කරනු ලැබිය හැකිය.

3. මේ ව්‍යවස්ථාවේ 2 වන ඡේදයට අනුකූලව පරීක්ෂණයක් පවත්වනු ලබන්නේ නම්, කමිටුව විසින් අදාළ පාර්ශව රාජ්‍යයේ සහයෝගය ලබා ගත යුතුය. එම පාර්ශව රාජ්‍යයේ එකඟත්වය ඇතිව, එවැනි පරීක්ෂණයකට එම රාජ්‍යයේ භූමි ප්‍රදේශය තුලට නිරීක්ෂණ චාරිකාවක් ද ඇතුළත් විය හැකිය.

4. මේ ව්‍යවස්ථාවේ 2 වන ඡේදයට අනුකූලව ඉදිරිපත් කරන ලද කමිටුවේ සාමාජිකයන්ගේ සොයාගැනීම් හෝ සාමාජිකයන්ගේ සැලකිරීම් පරීක්ෂා කිරීමෙන් පසුව, අවස්ථාව සැලකිල්ලට ගැනීමේදී උචිත යයි පෙනී යන යම් ගුණදොස් විවේචන හෝ යෝජනා සහ ඉහත කී තීරණ කමිටුව විසින් අදාළ පාර්ශව රාජ්‍යය වෙත යවනු ලැබිය යුතුය.

5. මේ ව්‍යවස්ථාවේ 1 සිට 4 දක්වා වූ ඡේදවල සඳහන් කමිටුවේ සියලුම නීති කෘත්‍යය රහස්‍ය විය යුතු අතර එම නීති කෘත්‍යවල සියලුම අදියරවලදී පාර්ශව රාජ්‍යයේ සහයෝගය ලබාගත යුතුය. 2 වන ඡේදයට අනුකූලව කරන ලද යම් පරීක්ෂණයක් සම්බන්ධයෙන් සියලුම නීති කෘත්‍ය අවසන් කිරීමෙන් පසු, කමිටුව විසින්, අදාළ පාර්ශව රාජ්‍යය විමසීමෙන් පසු, 24 වන ව්‍යවස්ථාවට අනුකූලව සාදන ලද වාර්ෂික වාර්තාවෙහි, නීති කෘත්‍යවල ප්‍රතිඵල ලඝු විස්තරයක් ඇතුළත් කිරීමට කමිටුවට තීරණය කළ හැකිය.

## 21 වන ව්‍යවස්ථාව

1. යම් පාර්ශව රාජ්‍යයක් මේ සම්මුතිය යටතේ ස්වකීය වගකීම් ඉටු නොකරන බවට වෙනත් පාර්ශව රාජ්‍යයක් කියා සිටින බව සඳහන් වන සංනිවේදන ලබාගැනීමට සහ සලකා බැලීමට කමිටුවට බලය ඇති බව යම් පාර්ශව රාජ්‍යයක් විසින් පිළිගනු ලබන බවට මේ සම්මුතියේ පාර්ශවකරුවකු වන යම් රාජ්‍යයක් විසින් මේ ව්‍යවස්ථාව යටතේ කවර හෝ අවස්ථාවක දී ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකිය. එවැනි සංනිවේදනයක් මේ ව්‍යවස්ථාවෙන් පනවා ඇති කාර්ය පටිපාටියට අනුකූලව ලබාගෙන සලකා බැලිය හැකි වනුයේ කමිටුවේ බලය පිළිගනිමින් ප්‍රකාශයක් කර ඇති

පාර්ශව රාජ්‍යයන් විසින් ඉදිරිපත් කර ඇත්නම් පමණි. යම් සංනිවේදන ප්‍රකාශයක් කර නොමැති පාර්ශව රාජ්‍යයකට අදාළ වන්නේ නම්, එම සංනිවේදනය පිළිබඳව කමිටුව විසින් මේ ව්‍යවස්ථාව යටතේ ක්‍රියා නොකළ යුතුය. මේ ව්‍යවස්ථාව යටතේ ලැබුන සංනිවේදනය පිළිබඳව පහත දැක්වෙන කාර්ය පටිපාටියට අනුකූලව ක්‍රියා කළ යුතුය.

(අ) යම් පාර්ශව රාජ්‍යයක් විසින් මේ සම්මුතියේ විධිවිධාන බලාත්මක නොකරන බවට වෙනත් පාර්ශව රාජ්‍යයන් විසින් සලකනු ලබන්නේ නම්, එම පාර්ශව රාජ්‍යය විසින් ලිඛිත සංනිවේදනයක් මගින්. මෙම කරුණ පිළිබඳව එම පාර්ශව රාජ්‍යයේ අවධානය යොමු කරවනු ලැබිය යුතු ය. සංනිවේදනය ලැබීමෙන් පසු මාස තුනක් ඇතුළත, එසේ සංනිවේදනය ලැබුන රට විසින්. සංනිවේදනය එවූ රට වෙත. කරුණු පැහැදිළි කරමින් ලිඛිත පැහැදිලි කිරීමක් හෝ වෙනත් යම් ප්‍රකාශයක් ලබා දිය යුතුය. එම කරුණු පැහැදිලි කිරීමට. හැකිතාක් දුරට සහ අදාළ වන ප්‍රමාණයට, දේශීය කාර්ය පටිපාටිය සහ සිදු කරන ලද ප්‍රතිකර්ම පිළිබඳව සඳහනක් තිබිය යුතුය.

(ආ) මුල් සංනිවේදනය. ලැබුන රාජ්‍යය වෙත ලැබීමෙන් පසු මාස හයක් ඇතුළත. අදාළ පාර්ශව රාජ්‍යයන් දෙකම සෑහීමට පත්වන පරිදි අදාල කරුණ සමථයකට පත් නොවුවහොත්, කමිටුව සහ අනෙක් රාජ්‍යය වෙත දැනුම්දීමෙන් පසු. එම කරුණ කමිටුව වෙත යොමු කිරීමට පාර්ශවයන් දෙකෙන් එකකට අයිතියක් ඇත.

(ඇ) මේ ව්‍යවස්ථාව යටතේ කමිටුව වෙත යොමු කරනු ලැබූ කරුණ පිළිබඳව කමිටුව විසින් ක්‍රියා කළ යුත්තේ සාමාන්‍යයෙන් පිළිගනු ලබන ජාත්‍යන්තර නීති මූලධර්මවලට අනුකූලව, මෙම කරුණ සම්බන්ධයෙන් සියලුම දේශීය ප්‍රතිකර්මවල පිහිට පතා ඒවා අවසන්වී ඇති බවට කමිටුව දැන ගැනීමෙන් පසුව පමණි. ප්‍රතිකර්ම අදාළ කර ගැනීම

අසාධාරණ ලෙස කල්දමා ඇති අවස්ථාවක හෝ මේ ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමේ ගොදුරක් බවට පත් වූ තැනැත්තාට ඵලදායි සහන ලබා දීමට ඉඩ නොමැති අවස්ථාවක, මෙම රීතිය අදාල නොවිය යුතුය.

(ඈ) මේ ව්‍යවස්ථාව යටතේ සංනිවේදනය පරීක්ෂා කරන විට, කමිටුව සංවෘත රැස්වීම් පැවැත්විය යුතුය.

(ඉ) (ඇ) උපපේදයේ විධිවිධානවලට යටත්ව, මේ සම්මුතියේ විධිවිධාන සළසා ඇති වගකීම්වලට ගරු කිරීමේ පදනම මත, මෙම කරුණ පිළිබඳව මිත්‍රශීලි විසඳුමක් ලබා ගැනීමේ අදහසින්, කමිටුව විසින් අදාළ පාර්ශව රාජ්‍යයන් වෙත සහාය ලබාදිය යුතුය.

(ඊ) මේ ව්‍යවස්ථාව යටතේ, කමිටුව වෙත යොමු කරන ලද යම් කාරණාවකදී, යම් අදාළ තොරතුරක් සපයන ලෙස (ආ) උපපේදයේ සඳහන් අදාළ පාර්ශව රාජ්‍යයන් වෙත කමිටුව විසින් ඉල්ලුම් කළ හැකිය.

(උ) කමිටුව විසින් කාරණාව සළකා බලන අවස්ථාවේ දී, නියෝජනය කිරීමේ අයිතිය සහ වාචික සහ/ හෝ ලිඛිත කරුණු සැළකිරීම් ඉදිරිපත් කිරීමේ අයිතිය (ආ) උපපේදයේ සඳහන් අදාළ පාර්ශව රාජ්‍යයකට තිබිය යුතුය.

(ඌ) කමිටුව විසින්, (ආ) උපපේදය යටතේ වූ දැන්වීමක් ලැබීමේ දිනයට පසුව මාස දොළහක් ඇතුළත,වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(i) (ඉ) උපපේදය ප්‍රකාරව වූ විසඳුමකට එළඹුනහොත්, කමිටුව විසින් ස්වකීය වාර්තාව සිද්ධිමය කරුණු පිළිබඳ සහ එළඹුන විසඳුම පිළිබඳ සංක්ෂිප්ත ප්‍රකාශයකට සීමා කළ යුතුය.

(ii) (ඉ) උපඡේදය ප්‍රකාරව වූ විසඳුමකට නොඑළඹුනහොත්, කමිටුව විසින් ස්වකීය වාර්තාව සිද්ධිමය කරුණු පිළිබඳ සංක්ෂිප්ත ප්‍රකාශයකට සීමා කළ යුතුය. අදාළ පාර්ශව රාජ්‍ය විසින් ඉදිරිපත් කරන ලද ලිඛිත කරුණු සැළකිරීම් සහ වාචික කරුණු සැළකිරීම්වල වාර්තාව, කමිටුවේ වාර්තාවට අමුණා තිබිය යුතුය. සෑම කාරණයකදීම, වාර්තාව, අදාල පාර්ශව රාජ්‍ය වෙත යවනු ලැබිය යුතුය.

2. මේ ව්‍යවස්ථාවේ 1 වන ඡේදය යටතේ මේ සම්මුතියට අදාළ පාර්ශව රාජ්‍ය 5 ක් විසින් ප්‍රකාශන කරනු ලැබූ විට, මේ ව්‍යවස්ථාවේ විධිවිධාන බලාත්මක විය යුතුය. පාර්ශව රාජ්‍යයන් විසින්, එම ප්‍රකාශන එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා වෙත යවනු ලැබිය යුතු අතර මහලේකම්වරයා විසින් එම ප්‍රකාශනවල පිටපත් වෙනත් පාර්ශව රාජ්‍යයන් වෙත යවනු ලැබිය යුතුය. ඕනෑම අවස්ථාවක මහලේකම්වරයා වෙත දැනුම්දීමෙන් පසුව ප්‍රකාශනයක් ඉල්ලා අස්කරගත හැකිය. මේ ව්‍යවස්ථාව යටතේ යවන ලද සංනිවේදනයක විෂය වන යම් කාරණයක් පිළිබඳව සළකා බැලීම කෙරෙහි එවැනි ඉල්ලා අස්කර ගැනීමකින් බලපෑමක් සිදු නොවිය යුතුය. අදාළ පාර්ශව විසින් අලුත් ප්‍රකාශනයක් කර ඇත්නම් මිස, ප්‍රකාශනය ඉල්ලා අස්කර ගැනීම පිළිබඳ නිවේදනය මහලේකම්වරයාට ලැබීමෙන් පසුව, මේ ව්‍යවස්ථාව යටතේ කිසිදු පාර්ශව රාජ්‍යයකින් තවදුරටත් නිකුත් කරනුලබන සංනිවේදනයක් භාර නොගත යුතුය.

## 22 වන ව්‍යවස්ථාව

1. මේ සම්මුතියේ පාර්ශව රාජ්‍යයක් විසින් සිදු කරන ලද ප්‍රචණ්ඩ ක්‍රියාවලියට ගොදුරු වූ තැනැත්තකු බවට කියා සිටින පුද්ගලයකුගෙන් හෝ එවැනි පුද්ගලයකු වෙනුවෙන්, කමිටුවේ අධිකරණ බලයට යටත්ව, සංනිවේදන භාරගෙන ඒවා පිළිබඳව සලකා බැලීමට කමිටුවට බලය ඇති බවට තමන් පිළිගන්නා බවට මේ සම්මුතියේ පාර්ශව රාජ්‍යයක් විසින් කවර හෝ අවස්ථාවකදී මේ ව්‍යවස්ථාව යටතේ ප්‍රකාශයක් කරනු ලැබිය

හැකිය. යම් සංනිවේදනයක්, එවැනි ප්‍රකාශනයක් කර නොහැකි පාර්ශව රාජ්‍යයක් සම්බන්ධයෙන් වන්නේ නම්, එම සංනිවේදන, කමිටුව විසින් භාර නොගත යුතුය.

2. මේ ව්‍යවස්ථාව යටතේ වූ යම් සංනිවේදනයක්, නිර්නාමික නම් හෝ එවැනි සංනිවේදන ඉදිරිපත් කිරීමේ අයිතිය අයුතු ලෙස ප්‍රයෝජනයට ගැනීමක් බවට කමිටුව සලකන්නේ නම් හෝ මේ සම්මුතියේ විධිවිධානවලට නොගැලපෙන්නේ නම් හෝ කමිටුව විසින් එම සංනිවේදනය ආවේශ්‍ය කළ නොහැකි බවට සලකනු ලැබිය යුතුය.

3. 1 වන ඡේදය යටතේ ප්‍රකාශනයක් කර ඇත්තා වූද, සම්මුතියේ යම් විධිවිධානයක් උල්ලංඝනය කර ඇති බවට චෝදනා ලැබ සිටින්නාවූද, සම්මුතියේ යම් පාර්ශව රාජ්‍යයක අවධානය, කමිටුව විසින්, 2 වන ඡේදයේ විධිවිධානවලට යටත්ව, මේ ව්‍යවස්ථාව යටතේ තමා වෙත ඉදිරිපත් කරන ලද, යම් සංනිවේදනයක් වෙත යොමු කරනු ලැබිය යුතුය. මාස හයක් ඇතුළත, ලැබුණ රාජ්‍යය විසින්, එම කරුණ පැහැදිලි කරමින් ලිඛිත කරුණු පැහැදිලි කිරීම් හෝ ප්‍රකාශ ද එම රාජ්‍ය විසින් කළ හැකිව තිබූ ප්‍රතිකර්ම ඇත්නම්, එම ප්‍රතිකර්ම ද කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය.

4. අදාළ පුද්ගලයා විසින් සහ ඔහු වෙනුවෙන් ද, අදාළ පාර්ශවය විසින් ද, කමිටුව වෙත සපයන ලද සියලු තොරතුරු සැලකිල්ලට ගෙන, මේ ව්‍යවස්ථාව යටතේ ලැබුන සංනිවේදන, කමිටුව විසින් සලකා බැලිය යුතුය.

5. පහත සඳහන් කරුණු කමිටුවට දැනගැනීමට ලැබුනහොත් මිස, යම් පුද්ගලයෙකුගෙන් ලැබෙන සංනිවේදන, කමිටුව විසින් සලකා බැලිය යුතු නොවේ.

(අ) එම කරුණම, වෙනත් ජාත්‍යන්තර විමර්ශනයක හෝ සමථයක කාර්ය පටිපාටිය යටතේ පරීක්ෂාවට භාජන කරනු ලැබ නොමැති බව හෝ දැනට පරීක්ෂාවට භාජන වෙමින් නොපවතින බව,

(ආ) දේශීය වශයෙන් ඇති සියලු ප්‍රතිකර්ම කිරීම තැනැත්තා විසින් අවසන් කර ඇති බව එසේ ප්‍රතිකර්ම අදාළ කර ගැනීම අසාධාරණ ලෙස කල් දමමින් සිටින විට හෝ මේ සම්මුතිය උල්ලංඝනය කරමින් ගොදුරක් බවට පත් වූ තැනැත්තාට ඵලදායි සහන ලබා ගැනීමට නොහැකි වන විට, ඉහත රීතිය අදාළ නොවේ.

6. මේ ව්‍යවස්ථාව යටතේ සංනිවේදන පරීක්ෂා කිරීමේදී, කමිටුව රහසිගතව රැස්වීම පැවැත්විය යුතුය.

7. කමිටුව විසින් ස්වකීය අදහස් අදාළ පාර්ශව රාජ්‍යයට සහ අදාළ පුද්ගලයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

8. මේ ව්‍යවස්ථාවේ 1 වන ඡේදය යටතේ මේ සම්මුතියේ පාර්ශව රාජ්‍ය පහක් ප්‍රකාශන කළ විට, මේ ව්‍යවස්ථාවේ විධිවිධාන බලාත්මක විය යුතුය. පාර්ශව රාජ්‍යයන් විසින් එම ප්‍රකාශය එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා වෙත යැවිය යුතු අතර එම ප්‍රකාශනවල පිටපත් මහලේකම්වරයා විසින් පාර්ශව රාජ්‍ය වෙත යවනු ලැබිය යුතුය. මහලේකම්වරයා වෙත දැනුම් දීමෙන් පසු කවර හෝ අවස්ථාවකදී ප්‍රකාශනයක් ඉල්ලා අස්කරගත හැකිය. මේ ව්‍යවස්ථාව යටතේ යවා ඇති සංනිවේදනයක විෂය කරුණු වන යම් කරුණක් සලකා බැලීම කෙරෙහි එවැනි ඉල්ලා අස්කර ගැනීමකින් බලපෑමක් සිදු නොවිය යුතුය. පාර්ශව රාජ්‍ය විසින් අලුත් ප්‍රකාශයක් කර ඇත්නම් මිස, ප්‍රකාශනය ඉල්ලා අස්කර ගැනීම පිළිබඳ නිවේදනය මහ ලේකම්වරයා වෙත ලැබීමෙන් පසු මේ ව්‍යවස්ථාව යටතේ, තවදුරටත් යම් පුද්ගලයෙකු හෝ ඔහු වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන සංනිවේදනයක් භාර නොගත යුතු ය.

## 23 වන ව්‍යවස්ථාව

කමිටුවේ සහ 21 වන ව්‍යවස්ථාවේ 1 (ඉ) ඡේදය යටතේ පත් කරනු ලැබිය හැකි හදිසි සමථ කොමිෂන් සභාවල සාමාජිකයන්ට,

එක්සත් ජාතීන්ගේ වරප්‍රසාද හා මුක්ත පිළිබඳ සම්මුතියේ අදාළ වගන්තිවල සඳහන් පරිදි එක්සත් ජාතීන් සඳහා වූ දූත මණ්ඩලවල විශේෂඥයන්ගේ පහසුකම්, වරප්‍රසාද සහ මුක්ත සඳහා හිමිකම් තිබිය යුතුය.

## 24 වන ව්‍යවස්ථාව

කමිටුව විසින් මේ සම්මුතිය යටතේ ස්වකීය කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාවක් පාර්ශව රාජ්‍යයන්ට සහ එක්සත් ජාතීන්ගේ මහ සභාවට ඉදිරිපත් කළ යුතුය.

# 3 වන කොටස

## 25 වන ව්‍යවස්ථාව

1. මේ සම්මුතිය, සියලු රාජ්‍යයන් විසින් අත්සන් කිරීම සඳහා විවෘතව ඇත.

2. මෙම සම්මුතිය සපථ කිරීමට යටත් වේ. සපථ කිරීම පිළිබඳ සාධන පත එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

## 26 වන ව්‍යවස්ථාව

මෙම සම්මුතිය පිළිගැනීම සඳහා සියලුම රාජ්‍යයන්ට විවෘතව ඇත. පිළිගැනීම බලාත්මක වනුයේ පිළිගැනීම පිළිබඳ සාධන පත්‍රයක් එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා වෙත තැන්පත් කිරීමෙනි.

## 27 වන ව්‍යවස්ථාව

1. සපථ කිරීම හෝ පිළිගැනීම පිළිබඳ විසිවන සාධක පත්‍රය එක්සත්

ජාතීන්ගේ මහලේකම්වරයා වෙත භාරදීමෙන් පසු තිස්වන දිනයේ සිට මේ සම්මුතිය බලාත්මක විය යුතුය.

2. සපථ කිරීම හෝ පිළිගැනීම පිළිබඳ විධිවත සාධන පත්‍රය ඉදිරිපත් කිරීමෙන් පසු මේ සම්මුතිය සපථ කිරීම කරන හෝ එයට එකඟතාව පළකරන එක් එක් රාජ්‍යය සඳහා, මෙම සම්මුතිය ක්‍රියාත්මක වීම, එම රාජ්‍යයේ සපථ කිරීම හෝ පිළිගැනීම පිළිබඳ සාධන පත්‍රය ඉදිරිපත් කිරීමේ දිනයට පසුව එළඹෙන තිස්වන දිනයේ සිට බලපැවැත්විය යුතුය.

## 28 වන ව්‍යවස්ථාව

1. එක් එක් රාජ්‍යය විසින්, මේ සම්මුතියට අත්සන් තබන හෝ එය සපථ කරන හෝ එය පිළිගනු ලබන අවස්ථාවේදී, 20 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සළකා ඇති පරිදි කමිටුවේ බලය එය විසින් පිළි නොගන්නා බවට ප්‍රකාශයක් කළ යුතුය.

2. මේ ව්‍යවස්ථාවේ 1 වන ඡේදයට අනුකූලව වෙන් කිරීමක් සිදු කර ඇති යම් පාර්ශව රාජ්‍යයක් විසින්, කවර හෝ අවස්ථාවකදී එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා වෙත කරනු ලබන නිවේදනයක් මගින් මෙම වෙන්කිරීම ඉල්ලා අස්කරගත හැකිය.

## 29 වන ව්‍යවස්ථාව

1. මේ ව්‍යවස්ථාවේ යම් පාර්ශව රාජ්‍යයක් විසින් සංශෝධනයක් යෝජනා කළ හැකි අතර එය එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා වෙත ගොනු කරනු ලැබිය හැකිය. ඉන්පසු මහලේකම්වරයා විසින් යෝජිත සංශෝධනය පිළිබඳව පාර්ශව රාජ්‍ය වෙත දැනුම් දෙමින් එම යෝජනාව පිළිබඳව සළකා බලා ඡන්දය දීමේ කාර්ය සඳහා එම පාර්ශව රාජ්‍යයන්ගේ සාකච්ඡාවක් පැවැත්වීමට කැමති ද යන්න තමා වෙත දැනුම් දෙන ලෙස එම රාජ්‍යයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකිය. එම නිවේදනයේ දින සිට මාස හතරක් ඇතුළත අවම වශයෙන් පාර්ශව රාජ්‍යයන්ගෙන් තුනෙන්

එකක් වත් සාකච්ඡාවකට සැමැත්ත පළ කළ හොත්, මහලේකම්වරයා විසින් එක්සත් ජාතීන්ගේ මෙහෙයවීම යටතේ සාකච්ඡාව කැඳවනු ලැබිය හැකිය. පැමිණ සිට ඡන්දය දෙන පාර්ශව රාජ්‍යයන්ගෙන් බහුතරය විසින් ඉදිරිපත් කරනු ලබන යම් සංශෝධනයක්, පිළිගැනීම සඳහා, මහලේකම්වරයා විසින් සියලුම පාර්ශව රාජ්‍ය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

2. මේ ව්‍යවස්ථාවේ 1 වන ඡේදයට අනුකූලව පිළිගනු ලබන යම් සංශෝධනයක්, මේ සම්මුතියේ පාර්ශව රාජ්‍ය වලින් තුනෙන් දෙකක් විසින් ස්වකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ක්‍රියාවලියට අනුකූලව පිළිගෙන ඇති බවට එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයාට දැනුම්දීමෙන් පසුව, බලාත්මක විය යුතුය.

3. සංශෝධන බලාත්මක වන විට, ඒවා පිළිගත් පාර්ශව රාජ්‍යයන් ඒවායින් බැඳී සිටින අතර වෙනත් පාර්ශව රාජ්‍යයන් මේ සම්මුතියේ විධිවිධානවලින් සහ එම රාජ්‍යයන් විසින් පිළිගනු ලැබූ පෙර සංශෝධන වලින් බැඳී සිටිය යුතුය.

## 30 වන ව්‍යවස්ථාව

1. මේ සම්මුතිය අර්ථ නිරූපණය කිරීම හෝ අදාළ කර ගැනීම සම්බන්ධයෙන් පාර්ශව රාජ්‍යයන් දෙකක් හෝ ඊට වැඩි ගණනක් අතර ඇති වන්නාවූද, සාකච්ඡා මගින් සමථයට පත් කළ නොහැකි වූද, යම් ආරවුලක්, එක් පාර්ශවයක ඉල්ලීම පිට, බේරුම් කිරීම සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතුය. බේරුම් කිරීම සඳහා ඉල්ලීමේ දින සිට මාස හයක් ඇතුළත, බේරුම් කිරීමේ යෝජනා පිළිබඳව එකඟවීමට පාර්ශව කරුවන්ට නොහැකි වන්නේ නම්, එම පාර්ශවකරුවන්ගෙන් එක් පාර්ශවකරුවකු විසින් එම ආරවුල " ඉන්ටර්නැෂනල් කෝට් ඔෆ් ජස්ටින් බයි රික්වෙස්ට්" නම් වූ ජාත්‍යන්තර අධිකරණයේ ප්‍රඥප්තිවලට අනුකූලව, එම අධිකරණය වෙත යොමු කරනු ලැබිය යුතුය.

2. එක් එක් රාජ්‍යය විසින් මේ සම්මුතිය අත්සන් කිරීමේ හෝ සපට කිරීමේ අවස්ථාවේදී හෝ එය පිළිගනු ලබන අවස්ථාවේදී එම රාජ්‍යය මේ ව්‍යවස්ථාවේ 1 වන ඡේදය මගින් බැඳී සටිම නොපිළිගන්නා බවට ප්‍රකාශ කළ යුතුය. එවැනි අවශේෂණයක් සිදුකර ඇති යම් පාර්ශව රාජ්‍යයන්ට අදාළව මේ ව්‍යවස්ථාවේ 1 වන ඡේදයෙන් වෙනත් පාර්ශව රාජ්‍යයන් බැඳී නොසිටී.

3. මේ ව්‍යවස්ථාවේ 2 වන ඡේදයට අනුකූලව අවශේෂණයක් සිදුකර ඇති යම් පාර්ශව රාජ්‍යයක් විසින් එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා වෙත කරනු ලබන නිවේදනයක් මගින් කවර හෝ අවස්ථාවකදී, මෙම අවශේෂණය ඉල්ලා අස්කර ගත හැකිය.

## 31 වන ව්‍යවස්ථාව

1. එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන ලිඛිත නිවේදනයක් මගින් පාර්ශව රාජ්‍යයක් විසින් මෙම සම්මුතියෙන් ඉවත්විය හැකිය. මහලේකම්වරයා වෙත දැනුම් දී ඇති දින සිට එක් අවුරුද්දක් පසු වූ විට, ඉවත්වීම බලාත්මක වේ.

2. එසේ ඉවත්වීම බලාත්මක වන දිනයට පෙරාතුව සිදු කරන ලද යම් ක්‍රියාවක් හෝ අත්හැරීමක් සම්බන්ධයෙන් සම්මුතිය යටතේ සිය වගකීම්වලින් එම පාර්ශව රාජ්‍යය මුදා හැරීමේ බලපෑම, එම සම්මුතියෙන් ඉවත්වීමෙන් ඇති නොවන අතර ඉවත්වීම බලාත්මක වීමේ දිනයට පෙර කමිටුව විසින් දැනටමත් සළකා බලමින් සිටි යම් කරුණක් පිළිබඳව අඛණ්ඩව සලකා බැලීම කෙරෙහි එයේ සම්මුතියෙන් ඉවත්වීම බලනොපානු ඇත.

3. පාර්ශව රාජ්‍යයක් සම්මුතියෙන් ඉවත්වීමේ දිනයට පසුව, කමිටුව විසින් එම රාජ්‍යය සම්බන්ධයෙන් යම් අලුත් කරුණක් සලකා බැලීම ආරම්භ නොකළ යුතුය.

## 32 වන ව්‍යවස්ථාව

එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා විසින්, එක්සත් ජාතීන්ගේ සියලුම සාමාජික රටවල් වලටද, මේ සම්මුතියට අත්සන් තබා ඇති හෝ එය පිළගෙන ඇති සියලු රාජ්‍යවලටද, පහත දැක්වෙන කරුණු දැනුම් දිය යුතුය.

(අ) 25 සහ 26 වන ව්‍යවස්ථා යටතේ අත්සන් තැබීම්, සපට කිරීම් සහ පිළිගැනීම් පිළිබඳව

(ආ) 27 වන ව්‍යවස්ථාව යටතේ මේ සම්මුතිය බලාත්මක වන දිනය සහ 29 වන ව්‍යවස්ථාව යටතේ සංශෝධනයන් බලාත්මක වන දිනය

(ඇ) 31 වන ව්‍යවස්ථාව යටතේ සම්මුතියෙන් ඉවත්වීම

## 33 වන ව්‍යවස්ථාව

1. මෙම සම්මුතියේ අරාබි, චීන, ඉංග්‍රීසි, ප්‍රංශ, රුසියානු සහ ස්පාඤ්ඤ යන භාෂාවලින් ඇති භාෂා පාඨ නිවැරදි වන අතර මෙම සම්මුතිය එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා වෙත තැබිය යුතුය.

2. එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා විසින් මේ සම්මුතියේ සහතික පිටපත් සියලුම රාජ්‍යයන් වෙත යවනු ලැබිය යුතුය.

## ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

## 111 වන පරිච්ඡේදය

## මූලික අයිතිවාසිකම්

සිතීමේ නිදහස හෘදය, සාක්ෂියේ නිදහස හා ආගමික නිදහස.

10. සෑම තැනැත්තෙකුටම තමන් අභිමත ආගමක් ඇදහීමේ හෝ වැළඳ ගැනීමේ නිදහස ද ලබ්ධියක් හෝ විශ්වාසයක් දැරීමේ හෝ පිළිගැනීමේ නිදහස ද ඇතුළුව සිතීමේ නිදහසට, හෘදය සාක්ෂියේ නිදහසට හා ආගමික නිදහසට හිමිකම් ඇත්තේය

වධ හිංසා වලින් නිදහස.

11. කිසිම තැනැත්තෙකු වධ හිංසා වලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය.

සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම

12. (1) නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය.

[2] කිසිම පුරවැසියෙකු වර්ගය, ආගම, භාෂාව ද කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂයකට හෝ භාජන නොවිය යුත්තේය.

එසේ වුවද, රජයේ සේවයේ, අධිකරණ සේවයේ, පළාත් පාලන සේවයේ නැතහොත් යම් රාජ්‍ය සංස්ථාවක සේවයේ යම් සේවා නියුක්තියක හෝ ධුරයක කාර්ය ඉටු කිරීම සඳහා යම්

තැනැත්තෙකු යම් භාෂාවක් පිලිබඳ ප්‍රමාණවත් දැනීමක් ඇතිව සිටීම සාධාරණව අවශ්‍ය වන අවස්ථාවක ඒ සේවා නියුක්තිය හෝ ධුරය සඳහා සුදුසුකමක් වශයෙන් ඒ භාෂාව පිලිබඳව එසේ ප්‍රමාණවත් දැනීමක් සාධාරණ කාලයක් තුළ දී ලබා ගත යුතු යැයි එවැනි තැනැත්තෙකුට නියම කිරීම නීත්‍යානුකූල වන්නේය.

එසේම තවදුරටත් එවැනි යම් සේවා නියුක්තියක හෝ ධුරයක හෝ කිසිදු කර්තව්‍යක් යම් භාෂාවක් පිලිබඳ දැනීම ඇත්තේ නම් මිස ඉටු කළ නොහැකි වන අවස්ථාවන් වල දී ඒ සේවා නියුක්තියට හෝ ධුරයට හෝ ඇතුලත් කර ගැනීමේ සුදුසුකමක් වශයෙන් යම් තැනැත්තෙකුට ඒ භාෂාව පිලිබඳ ප්‍රමාණවත් දැනීමක් තිබිය යුතු යයි නියම කිරීම නීත්‍යානුකූල වන්නේය.

(3) වර්ගය, ආගම, භාෂාව, කුලය හෝ ස්ත්‍රී පුරුෂ භේදය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙළඳසැල් වලට, පොදු භෝජනාගාර වලට, ආපන ශාලා වලට, පොදු විනෝද ස්ථාන වලට හෝ තම තමාගේ ආගමට අයත් පොදු පූජනීය ස්ථාන වලට ඇතුලත්වීම සම්බන්ධයෙන් යම් අශක්නුතාවකට, බැඳීමකට, සීමා කිරීමකට නැතහොත් කොන්දේසියකට කිසිම තැනැත්තෙක් යටත් නොවන්නේය.

(4) කාන්තාවන්ගේ, ළමයින්ගේ හෝ අබල තැනැත්තන්ගේ ප්‍රගතිය සඳහා නීතියෙන් හෝ අනු නීති වලින් හෝ විධායක ක්‍රියා මාර්ගයෙන් හෝ විශේෂ විධිවිධාන සැලැස්වීම මේ ව්‍යවස්ථාවෙන් කිසියේත් අවහිර නොවන්නේය.

අත්තනෝමතික ව සිරභාරයට ගැනීමෙන්, රඳවා තබාගැනීමෙන් සහ දඬුවම් කිරීමෙන් නිදහස සහඅතීතයට බලපාන දණ්ඩන නීති පැනවීම තහනම් කිරීම

13. (1) නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු සිරභාරයට ගැනීම නොකළ යුත්තේ ය. යම් තැනැත්තෙකු සිරභාරයට ගනු ලබන්නේ යම් හේතුවක් මත ද ඒ හේතුව ඒ තැනැත්තාට දැන්විය යුත්තේ ය.

(2) අත් අඩංගුවෙහි තබා ගනු ලැබූ හෝ රඳවා තබා ගනු ලැබූ හෝ අන්‍යාකාරයකින් පෞද්ගලික නිදහස අහිමි කරනු ලැබූ හෝ සෑම තැනැත්තෙකුම නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටිය අනුව ආසන්නතම නිසි අධිකරණයේ විනිශ්චයකාරවරයා ඉදිරියට ගෙන යා යුතු අතර, නීතියෙන් නියම කරනු ලබූ කාර්ය පටිපාටියට අනුකූලව ඒ විනිශ්චයකාරවරයා විසින් කරනු ලැබූ අඥාව මත සහ ආඥාව ප්‍රකාර මිස, ඒ තැනැත්තා තව දුරටත් අත් අඩංගුවෙහි තබා ගැනීම හෝ රඳවා තබා ගැනීම හෝ ඒ තැනැත්තාගේ පෞද්ගලික නිදහස අහිමි කිරීම හෝ නොකළ යුත්තේ ය.

(3) වරදක් සම්බන්ධයෙන් යම්තැනැත්තෙකුට විරුද්ධව චෝදනා නගනු ලැබ ඇත්තේ ද ඒ තැනැත්තාට, නිසි අධිකරණයක් විසින් පවත්වනු ලබන සාධාරණ නඩු විභාගයක දී පෞද්ගලිකවම හෝ නීතිඥවරයකු මඟින් හෝ කරුණු කියා සිටීමට හිමිකම් ඇත්තේ ය.

(4) නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව නිසි අධිකරණයක් විසින් කරනු ලැබූ ආඥාවක් අනුව මි, කිසිම තැනැත්තෙකු මරණීය දණ්ඩනයට යටත් කිරීම හෝ කිසිම තැනැත්තෙකු බන්ධනාගාර ගත කිරීම

හෝ නොකළ යුත්තේ ය. එහෙත් විමර්ශනයක් පවත්වන තෙක් හෝ නඩු විභාගයක් පවත්වන තෙක් හෝ යම් තැනැත්තෙකු සිරගාරයට ගැනීම, අත් අඩංගුවේ තබා ගැනීම, රඳවා තබා ගැනීම හෝ අන්‍යාකාරයකින් ඒ තැනැත්තාගේ පෞද්ගලික නිදහස අහිමි කිරීම දඬුවමක් නොවන්නේය.

(5) වරදකරු යැයි ඔප්පු කරනු ලබන තෙක් සෑම තැනැත්තෙකුම නිර්දෝෂී යැයි පූර්වානුමාන කළ යුත්තේ ය.

එසේ වුවද, විශේෂ වූ සිද්ධි ඔප්පු කිරීමේ භාරය චූදිත තැනැත්තෙකු වෙත නීතියෙන් පවරනු ලැබිය හැක්කේ ය.

(6) යම් ක්‍රියාවක් කළ හෝ යම් නොකර හැරීමක් සිදුවූ අවස්ථාවේ දී ඒ ක්‍රියාව හෝ නොකර හැරීම වරදක් නොවේ නම් ඒ ක්‍රියාව හෝ නොකර හැරීම සම්බන්ධයෙන් කිසිම තැනැත්තෙකු වරදකට වරදකරුවකු නොවිය යුත්තේ ය. තවද, යම් වරදක් සිදු කරනු ලැබූ අවස්ථාවේ දී ඒ වරද සම්බන්ධයෙන් බලපැවැත් වූ දණ්ඩනයට වැඩි කිසිම දණ්ඩනයක් ඒ වරද සම්බන්ධයෙන් නියම නොකළ යුත්තේ ය.

යම් ක්‍රියාවක් කළ හෝ නොකර හැරීමක් සිදු වූ අවස්ථාවේ දී එය ජාතීන්ගේ සම්මතයෙන් පිළිගත් පොදු නෛතික මූලධර්ම අනුව සාපරාධී ක්‍රියාවක් හෝ නොකර හැරීමක් වූ විට, ඒ ක්‍රියාව හෝ නොකර හැරීම සම්බන්ධයෙන් කවර වූ හෝ තැනැත්තෙකු නඩු විභාගයට භාජනට කොට දඬුවම් කිරීමට මේ ව්‍යවස්ථාවේ ඇතුළත් කිසිවකින් හානියක් නොවන්නේය.

යම් වරදක් සඳහා නියම කරනු ලබන අවම දණ්ඩනය ඒ වරද සිදු කළ අවස්ථාවේ දී ඒ වරද සඳහා නියමිතව තිබුණු උපරිම දණ්ඩනය නොඉක්මවන්නේ නම්, ඒ වරද සඳහා එකී අවම දණ්ඩනය පනවන ලෙස නියම කිරීම මේ ව්‍යවස්ථාවේ විධිවිධාන කඩ කිරීමක් නොවන්නේ ය.

(7) ආගමික හා විගාමික පනතේ හෝ 1967 අංක 14 දරණ ඉන්දු ලංකා ගිවිසුම (ක්‍රියාත්මක කිරීමේ) පනතේ හෝ එකී පනත් වෙනුවට ආදේශ කිරීම සඳහා, පනවනු ලබන වෙනත් නීතියක හෝ විධිවිධාන යටතේ කරනු ලබන ඉවත්කිරීමේ නියමයක නැතහොත් රටින් පිට කිරීමේ නියමයක හේතුවෙන් යම් තැනැත්තෙකු සිර භාරයට ගැනීම, අත් අඩංගුවේ තබා ගැනීම, රඳවා තබා ගැනීම හෝ අන්‍යාකාරයකින් ඒ තැනැත්තාගේ පෞද්ගලික නිදහස අහිමි කිරීම මේ ව්‍යවස්ථාවේ විධි විධාන කඩ කිරීමක් නොවන්නේ ය.

භාෂණයේ රැස්වීමේ, සමාගමයේ, රැකියාවේ සහ යම් ඊම් යනාදියේ නිදහස

(14) (1) සෑම පුරවැසියෙකුටම :

(අ) භාෂණයේ නිදහසට හා ප්‍රකාශනය ඇතුළු අදහස් පළ කිරීමේ නිදහසට :

(ආ) සාමකාමීව රැස්වීමේ නිදහසට :

(ඇ) සමාගමයේ නිදහසට :

(ඈ) වෘත්තීය සමිති පිහිටුවීමේ සහ වෘත්තීය සමිති වලට බැඳීමේ නිදහසට :

(ඉ) එකලාව හෝ අන් අය හා සමඟ ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව තම ආගම, ලබ්ධිය හෝ විශ්වාසය ඇදහීමෙන්, පිළිපැදීමෙන් ප්‍රගුණ කිරීමෙන්, සහ ඉගැන්වීමෙන් ප්‍රකාශ කිරීමේ නිදහසට :

(ඊ) එකලාව හෝ අන් අය හා සමඟ හෝ ස්වකීය සංස්කෘතිය භුක්ති විඳීමේ හා වැඩි දියුණු කිරීමේ නිදහසට සහ ස්වකීය භාෂාව භාවිත කිරීමේ නිදහසට :

(උ) එකලාව හෝ අන් අය හා සමඟ යම් නීත්‍යානුකූල රැකියාවක, වෘත්තියක, කර්මාන්තයක, වෙළඳ, ව්‍යාපාරයක හෝ ව්‍යවසායක නියුක්ත වීමේ නිදහසට :

(ඌ) ශ්‍රී ලංකාව තුළ යාම ඊමේ නිදහසට සහ අභිමත ස්ථානයක වාසය කිරීමේ නිදහසට සහ

(එ) ශ්‍රී ලංකාවට පෙරළා පැමිණීමේ නිදහසට හිමිකම් ඇත්තේ ය.

(2) වෙනත් යම් කිසි රටක පුරවැසියෙකුව නොසිටිය දී ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන තෙක් ශ්‍රී ලංකාවෙහි ස්ථිරව සහ නීත්‍යානුකූලව පදිංචිව සිටියා වූ සහ එසේ දිගටම පදිංචිව සිටින්නා වූ තැනැත්තෙකුටද, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මකවීම ආරම්භ වීමේ සිට අවුරුදු 10ක කාලයක් තුළ මෙම ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගනු ලැබ ඇති අයිතිවාසිකම් වලට හිමිකම් ඇත්තේ ය.

මූලික අයිතිවාසිකම් පිළිබඳ සීමා

15. (1) 13 වන ව්‍යවස්ථාවේ (5) වන සහ (6) වන අනු ව්‍යවස්ථා වලින් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේ ද, ක්‍රියාත්මක විය හැක්කේ ද, රාජ්‍ය ආරක්ෂාව තහවුරු කිරීම පිණිස නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් වලට පමණක් යටත්ව ය. මෙම අනු ව්‍යවස්ථාවේ කාර්ය සඳහා "නීතිය" යන්නට මහජන ආරක්ෂාව පිළිබඳ තත් කාලයේ අදාළ වන නීතිය යටතේ සාදන ලද නියෝගද ඇතුළත් වන්නේ ය.

(2) 14 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (අ) ඡේදයෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේ ද, ක්‍රියාත්මක විය හැක්කේද, වාර්ගික හා ආගමික සහයෝගිතාව තහවුරු කිරීම සඳහා හෝ පාර්ලිමේන්තු වරප්‍රසාද, අධිකරණයට අපහාස කිරීම, අපහාස හෝ වරදකට පෙළඹවීම හා සම්බන්ධව නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් වලට යටත්ව ය.

(3) 14 වන ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ (අ) ඡේදයෙන් ප්‍රකාශ කොට ඇති මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේද, ක්‍රියාත්මක විය හැක්කේ ද, වාර්ගික හා ආගමික සහයෝගිතාව තහවුරු කිරීම සඳහා හෝ ජාතික ආර්ථිකය ආරක්ෂා කිරීම සඳහා නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් වලට යටත්ව ය.

(4) 14 වන ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ (ඇ) ඡේදයෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය

හැක්කේද, ක්‍රියාත්මක විය හැක්කේ ද, වාර්ගික හා ආගමික සහයෝගීතාව තහවුරු කිරීම සඳහා හෝ ජාතික ආර්ථිකය ආරක්ෂා කිරීම සඳහා නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් වලට යටත්ව ය.

(5) 14 වන ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ (උ) ඡේදයෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේද, ක්‍රියාත්මක විය හැක්කේ ද, ජාතික ආර්ථිකය ආරක්ෂා කිරීම සඳහා හෝ,

(අ) යම් වෘත්තියක යෙදී සිටීමට හෝ යම් රැකියාවක්, කර්මාන්තයක්, වෙළඳ ව්‍යාපාරයක් හෝ ව්‍යවසායක් පවත්වාගෙන යාමට අවශ්‍ය වෘත්තීය, කාර්මික, අධ්‍යාපනික, මූල්‍ය සහ වෙනත් සුදුසුකම් සම්බන්ධයෙන් සහ එම මූලික අයිතිවාසිකමට හිමිකම් ලබන තැනැත්තන්ට බලපත්‍ර දීම සහ එම තැනැත්තන් විශයෙහි විනය පාලනය සම්බන්ධයෙන් සහ,

(ආ) රජය විසින් හෝ රාජ්‍ය නියෝජිත ආයතනයක් විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් හෝ යම් කර්මාන්තයක්, වෙළඳ ව්‍යාපාරයක්, කාර්මික ව්‍යාපාරයක්, සේවාවක් හෝ ව්‍යවසායක් පුරවැසි සහභාගීත්වය නොමැතිව හෝ පුරවැසි කොටසක සහභාගීත්වය ඇති හෝ අන්‍යාකාරයකින් හෝ පවත්වාගෙන යාම සම්බන්ධයෙන්,

නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමාකිරීම් වලට යටත්ව ය.

(6) 14 වන ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ (ඌ) ඡේදයෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති

මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේද, ක්‍රියාත්මක විය හැක්කේ ද, ජාතික ආර්ථිකය ආරක්ෂා කිරීම සඳහා නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් වලට යටත් ය.

(7) 12 වන ව්‍යවස්ථාවෙන්, 13 වන ව්‍යවස්ථාවේ (1) වන හා (2) වන ව්‍යවස්ථාවලින් සහ 14 වන ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති සියළුම මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේ ද, ක්‍රියාත්මක විය හැක්කේ ද, රාජ්‍ය ආරක්ෂාවද, රටේ යථා පැවැත්ම ද තහවුරු කිරීම පිණිසත්, මහජන සෞඛ්‍ය හෝ සදාචාරය ආරක්ෂා කිරීම පිණිසත්, අන්‍යයන්ගේ අයිතිවාසිකම් හා නන් වැදෑරුම් නිදහස නිසි පරිදි පිළිගන්නා බවට සහ ඊට නිසි පරිදි ගරු කරන බවට වගබලා ගැනීම පිණිසත්, ප්‍රජාතාන්ත්‍රවාදී සමාජයක පොදු සුභසාධනය සඳහා යුක්ති සහගතව අවශ්‍ය දෑ සපුරාලීම පිණිසත් නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් වලට යටත්ව ය. මෙම අනු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා " නීතිය" යන්නට මහජන ආරක්ෂාව පිළිබඳව තත්කාලයේ අදාල වන නීතිය යටතේ සාදන ලද නියෝග ද ඇතුළත් වන්නේ ය.

(8) 12 වන ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවෙන්, 13 වන ව්‍යවස්ථාවෙන් සහ 14 වන ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගෙන පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් සන්නද්ධ හමුදාවන් හි සාමාජිකයන්ට, පොලිස් හමුදාවේ සාමාජිකයන්ට සහ රටේ යථා පැවැත්ම භාරව සිටින වෙනත් හමුදා වල සාමාජිකයන්ට අදාල වීමේදී එම අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේ

ද ක්‍රියාත්මක විය හැක්කේ ද, ඔවුන්ගේ කාර්යයන් යථා පරිදි ඉටු කරවා ගැනීම සහ ඔවුන් අතර විනය පවත්වා ගැනීම පිණිස නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම වලට යටත්ව.

පවත්නා ලිඛිත නීති සහ ලිඛිත නොවූ නීති බලපවත්වන බව

16 (1) පවත්නා ලිඛිත නීති සහ නීති අතුරෙන් යම් කිසි ලිඛිත නීතියක් හෝ ලිඛිත නොවූ නීතියක් මේ පරිච්ඡේදයේ මෙයට ඉහතින් ඇති විධිවිධාන වලට අනුකූල නොවූ වද, එකී සියළු පවත්නා ලිඛිත නීති සහ ලිඛිත නොවූ නීති බලාත්මකව ක්‍රියාත්මක වන්නේ ය.

(2) කවර වූ හෝ පවත්නා ලිඛිත නීතියකින් දඬුවමක් ලෙස පිළිගනු ලැබූ කවර වූ හෝ ආකාරයක දඬුවමකට කවර වූ හෝ තැනැත්තෙකු නිසි අධිකරණයක ආඥාව පිට යටත් කිරීම මේ පරිච්ඡේදයේ විධිවිධාන කඩකිරීමක් නොවන්නේ ය.

විධායක ක්‍රියා මගින් මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමට ප්‍රතිකර්මය.

17. මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ යම් තැනැත්තෙකුට හිමිවන යම් මූලික අයිතිවාසිකමක් යම් විධායක හෝ පරිපාලනමය ක්‍රියාවක් මගින් උල්ලංඝණය කර තිබීම හෝ උල්ලංඝණය කිරීමට අනාසන්නව තිබීම හෝ සම්බන්ධයෙන් 126 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සලසා ඇති පරිදි ශ්‍රේෂ්ඨාධිකරණයට ඉල්ලීමක් කිරීමට ඒ තැනැත්තාට හිමිකම් ඇත්තේ ය.

ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

# 1994 අංක 22 දරන
# වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැළකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය පනත

(සහතිකය සටහන් කළේ 1994 දෙසැම්බර් මස 20 වන දින )

# 1994 අංක 22 දරන වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැළකීමට හෝ දඬුවම්වලට විරෙහිව වූ සම්මුතිය පනත.

[සහතිකය සටහන් කළේ 1994 දෙසැම්බර් මස 20 වන දින ]

එල්.ඩී. - ඕ. 8/94

වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැළකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය බල ගැන්වීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා වූ පනතකි.

වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැළකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතියක් 1984 දෙසැම්බර් මස 10 වන දින නිව්යෝර්ක් නගරයේ දී අත්සන් කරන ලද හෙයින් ද :

1994 ජනවාරි මස 3 වන දිනැති වූ ද, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා ලේකම්වරයා වෙත 1993 දෙසැම්බර් මස 29 වන දින තැන්පත් කරන ලද්දා වූ ද, එකඟවීමේ සාධන පත්‍රයක් මඟින් ශ්‍රී ලංකාවට ඉහත කී සම්මුතිය පිළිගෙන ඇති හෙයින් ද :

ඉහත කී සම්මුතිය ශ්‍රී ලංකාවට අදාළව 1994 පෙබරවාරි මස 2 වන දින සිට බලාත්මකවීම ආරම්භ වී ඇති හෙයින් ද :

ඉහත කී සම්මුතිය යටතේ ශ්‍රී ලංකාවේ බැඳීම් ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යවස්ථාමය විධිවිධාන පැනවීමට අවශ්‍යව ඇති හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :

ලුහුඬු නාමය

1. මේ පනත 1994 අංක 22 දරන වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැළකිමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

වධදීම වරදක් වනබව

2. (1) වෙනත් යම් තැනැත්තකුට වධදෙන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ වරදක්

(අ) සිදු කිරීමට තැත් කරන.

(ආ) සිදු කිරීමට ආධාර හා අනුබල දෙන.

(ඇ) සිදු කිරීමට කුමන්ත්‍රණය කරන,

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතුය.

(3) ලිඛිත නීතිය මඟින් පිළිගත් කවර හෝ ස්වරූපයක දඬුවමකට නිසි බලය ඇති අධිකරණයක ආඥාව අනුව යම් තැනැත්තකු යටත් කිරීම (1) වන උපවගන්තිය යටතේ වරදක් වන ලෙය නොසැළකිය යුතුය.

(4) මේ පනත යටතේ වරදකට වරදකරු වන තැනැත්තකු මහාධිකරණය විසින් නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ විට අවුරුදු හතකට නොඅඩු සහ අවුරුදු දහයකට නොවැඩි කාලයක් දෙයාකාරයකින් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට සහ රුපියල් දස දහසකට නොඅඩු සහ රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

(5) මේ පනත යටතේ වූ වරදක් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ

අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා ආඥාය වරදක් සහ ඇපදිය නොහැකි වරදක් විය යුතු ය.

යුද්ධමය තත්වයක් යනාදිය පවත්නා විට හෝ උසස් නිලධරයකුගේ නියමයක් මත හෝ කරනලද යම් ක්‍රියා මේ පනත යටතේ වරදක් සම්බන්ධව විත්තිවාචකයක් නොවන බව

3. මේ පනත යටතේ වරදක් සංයුක්ත කරන යම් ක්‍රියාවක්

(අ) යුද්දමය තත්වයක්, යුද්ධමය තර්ජනයක්, අභ්‍යන්තර දේශපාලන අස්ථිරතාවක් හෝ මහජන හදිසි අවස්ථාවක් පවත්නා අවස්ථාවක

(ආ) උසස් නිලධරයකුගේ හෝ රාජ්‍ය අධිකාරියක නියමයක් මත සිදු කරන ලද්දයි යන කරුණ, ඒ වරද සිදුකිරීම සම්බන්ධයෙන් විත්තිවාචකයක් නොවිය යුතු යයි, සැක දුරු කිරීම පිණිස මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරන ලද මේ පනත යටතේ වූ වැරදි විභාග කිරීමට මහාධිකරණයට බලය ඇති බව

4. (1) යම් තැනැත්තකු ශ්‍රී ලංකාවේ පුරවැසියකු වුවද නොවුවද, ඒ තැනැත්තා විසින් ශ්‍රී ලංකාවේ දේශයෙන් පිටත යම් ස්ථානයක දී සිදු කරන ලද මේ පනත යටතේ වූ වරදක්

(අ) වරදකරු ශ්‍රී ලංකාවෙහි සිටින හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද නැවක හෝ ගුවන් යානයක සිටින

(ආ) වරදක් සිදු කරන ලද්දැයි කියනු ලබන යම් තැනැත්තා ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන හෝ,

(ඇ) වරද සිදු කරන ලද්දැයි කියනු ලබන යම් තැනැත්තකුට අදාළව ද ඒ තැනැත්තා ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන

යම් අවස්ථාවක, ඒ වරද සම්බන්ධයෙන් විභාග කිරීමට හා නඩු විභාග කිරීමට ශ්‍රී ලංකාවේ මහාධිකරණයට අධිකරණ බලය තිබිය යුතු ය.

(2) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකු විසින්, ශ්‍රී ලංකාවේ දේශයෙන් පිටත සිදු කරන ලද, මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහාධිකරණයේ අධිකරණ බලය අග්‍රවිනිශ්චයකාරවරයාගේ අත්සන යටතේ ලියවිල්ලක් මගින් අග්‍රවිනිශ්චයකාරවරයා විසින් නම් කරනු ලබන අධිකරණ කලාපයේ පවත්වනු ලබන මහාධිකරණය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

සාක්ෂි

5. යම් අපරාධ නඩු කටයුත්තක දී, වෙනත් අවස්ථාවල දී අවශ්‍ය නොවන පාපොච්චාරණයක්, මේ පනත යටතේ පවරන ලද නඩු කටයුතුවල දී, එම පාපොච්චාරණය කිරීමේ කරුණ ඔප්පු කිරීමේ කාර්යය සඳහා පමණක් ආවේශ්‍ය කරනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ සිරභාරයට ගනු ලැබූ ඇතැම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්.

6. ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකු මේ පනත යටතේ වූ වරදකට සිරභාරයට ගත් අවස්ථාවක, ඔහු පුරවැසියකු වන රාජ්‍යයේ ළඟම සිටින උචිත නියෝජිතයා සමඟ ද, හෝ එකී තැනැත්තා රාජ්‍යයකට අයත් නොවන තැනැත්තකු නම් ඔහු සමාන්‍යයෙන් පදිංචිව සිටින රාජ්‍යයේ, ළඟම සිටින උචිත නියෝජිතයා සමඟ නොපමාව ම සන්නිවේදන සිදු කිරීමට ඔහුට හිමිකම් තිබිය යුතු ය.

වරදක් පිළිබඳව අධිකරණ බලය ඇති අනිකුත් රාජ්‍යවලට දැනුම්දීමට අමාත්‍ය වරයාට ඇති යුතුකම්

7. (1) මේ පනත යටතේ වූ වරදකට යම් තැනැත්තකු සිරභාරයට ගත් අවස්ථාවක, එම වරද සඳහා ඒ තැනැත්තාට විරුද්ධව නඩු පැවරීමට හෝ ඒ තැනැත්තා උද්ර්පණය කිරීමට ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ගත් හෝ ගැනීමට යෝජනා කරන පියවර ගැන, එම වරද පිළිබඳව අධිකරණ බලය ඇති වෙනත් යම් රාජ්‍යයක අදාළ නිලධාරීන්ට විදේශ කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විසින් දැන්විය යුතු ය.

(2) වධදීමේ වරදට චෝදනා කරනු ලැබූ හෝ වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු උද්ර්පණය කිරීම සඳහා යම් රාජ්‍යයක ආණ්ඩුව විසින් හෝ වෙනුවෙන් ශ්‍රී ලංකා ආණ්ඩුව වෙත ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක, විදේශ කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විසින්, ශ්‍රී ලංකා ආණ්ඩුව වෙනුවෙන් එම වරද සම්බන්ධයෙන් එම තැනැත්තාට නඩු පැවරීමට හෝ එම තැනැත්තා උද්ර්පනය කිරීම ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ගෙන ඇති හෝ ගැනීමට යෝජනා කරනු ලබන පියවර පිළිබඳව, ඉල්ලුම් කරන රාජ්‍යයේ ආණ්ඩුවට නොපමාව ම දැනුම් දිය යුතු ය.

(3) වධදීමේ චූදිත හෝ වරදකරු කරනු ලැබූ තැනැත්තකු ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්ර්පණ පනත යටතේ උද්ර්පණය කිරීම සඳහා යම් රාජ්‍යයක ආණ්ඩුව විසින් කරන ලද ඉල්ලීමක් අනුව ඒ තැනැත්තා ඒ පනත යටතේ උද්ර්පණය කිරීම සඳහා ආඥාවක් නොකළ යුතු බවට තීරණය කරන ලද අවස්ථාවක, ඒ තැනැත්තා චෝදනා ලැබූ වරද සඳහා ඔහුට විරුද්ධව නඩු පැවරිය හැකි වීම හෝ වෙනත් සුදුසු පියවරක් ගැන සළකා බැලිය හැකි වීම සඳහා එම කාරණය අදාළ බලධාරීන්ට ඉදිරිපත් කළ යුතු ය.

ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්ඝෝෂණ පනත සංශෝධනය කිරීම.

8. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්ඝෝෂණ පනත මේ පනතේ උපලේඛනයේ දක්වා ඇති පරිදි සංශෝධනය කරනු ලැබේ.

උද්ඝෝෂණ වැඩ පිළිවෙලවල් පිළිබඳ විධිවිධාන

9. (1) ශ්‍රී ලංකා ආණ්ඩුව හා වෙනත් යම් රාජ්‍යයක ආණ්ඩුව අතර උද්ඝෝෂණ වැඩ පිළිවෙලක් බලාත්මකව ඇති අවස්ථාවක දී, එම වැඩ පිළිවෙලට ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්ඝෝෂණ පනතේ කාර්ය සඳහා සම්මුතියේ අර්ථකථනය කර ඇති පරිදි වූ වධදීමේ වරද සහ එම වරද සිදු කිරීමට තැත් කිරීමේ,එම වරද සිදු කිරීමට ආධාර හා අනුබලදීමේ හෝ එම වරද සිදු කිරීමට කුමන්ත්‍රණය කිරීමේ වරද සම්බන්ධයෙන් උද්ඝෝෂණය සඳහා වූ විධිවිධාන ඇතුළත් ලෙස සළකනු ලැබිය යුතු ය.

(2) ශ්‍රී ලංකා ආණ්ඩුවට සහ යම් රාජ්‍යයක් අතර ඇති කර ගත් උද්ඝෝෂණ වැඩපිළිවෙලක් බලාත්මකව නොපවතින අවස්ථාවක, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මඟින් අමාත්‍යවරයා විසින්, ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්ඝෝෂණ පනතේ කාර්ය සඳහා සම්මුතිය. සම්මුතියේ අර්ථකථනය කර ඇති පරිදි වූ වධදීමේ වරද සහ එම වරද සිදු කිරීමට තැත් කිරීමේ, එම වරද සිදු කිරීමට ආධාර හා අනුබලදීමේ හෝ එම වරද සිදු කිරීමට කුමන්ත්‍රණය කිරීමේ වරද සම්බන්ධයෙන් උද්ඝෝෂණය සඳහා වූ විධිවිධාන සළස්වමින් ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් එම රාජ්‍යයේ ආණ්ඩුව සමඟ ඇති කර ගන්නා ලද උද්ඝෝෂණ වැඩ පිළිවෙලක් වශයෙන් සැළකිය හැකි ය.

අනිකුත් රාජ්‍යවලට උදව් කිරීමට ආණ්ඩුවේ යුතුකම

10. වධදීමේ වරද සම්බන්ධයෙන් යම් රාජ්‍යයක යම් තැනැත්තකුට විරුද්ධව පවරන ලද අපරාධ නඩු කටයුත්තක් සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි වන (ආණ්ඩුව සතුව ඇති යම් අදාළ සාක්ෂි සැපයීම ඇතුළුව ) ආධාර එම රාජ්‍යයේ අදාළ බලධාරීන්ට ආණ්ඩුව විසින් දිය යුතු ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය

12. පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි

"සම්මුතිය" යන්නෙන් 1984 දෙසැම්බර් මස 10 වන දින නිව්යෝර්ක් නගරයේ දී අත්සන් කරන ලද, වධදීමට සහ අනිකුත් කෲර අමානුෂික හෝ නින්දිත සැළකිම්වලට එරෙහිව වූ සම්මුතිය අදහස් වේ

"රජයේ නිලධරයා" යන්නෙන් ජනරජය යටතේ යම් ගෙවීමක් ලබන තනතුරක් දරන තැනැත්තෙකු අදහස් වේ

"වධදීම" යන්නෙහි ව්‍යාකරණානුකූල වෙනස්වීම සහ සජාතීය යෙදුම් ඇතුළුව. "වධදීම" යන්නෙන් වෙනත් යම් තැනැත්තකුට දැඩි ශාරීරික හෝ මානසික වේදනා ගෙන දෙන්නාවූ ද

(අ) පහත දැක්වෙන කාර්යයන් සඳහා,
එනම් :

(i) එකී වෙනත් තැනැත්තාගෙන් හෝ තුන්වන

තැනැත්තකුගෙන් යම් තොරතුරක් හෝ පාපොච්චාරණයක් යම් තොරතුරක් හෝ පාපොච්චාරණයක් ලබාගැනීම හෝ

(ii) එකී වෙනත් තැනැත්තා හෝ තුන්වන තැනැත්තකු විසින් කරන ලද, හෝ කරන ලදැයි සැක කෙරෙන යම් ක්‍රියාවක් සඳහා ඒ තැනැත්තාට දඬුවම් කිරීම සඳහා වූ ද,

(iii) එකී වෙනත් තැනැත්තා හෝ තුන්වන තැනැත්තකු බිය ගැන්වීම හෝ ඔහුට බල කිරීම් සඳහා

(ආ) වෙනස්කම් කිරීම මත පදනම් වූ වෙනත් හේතුවක් නිසා කරන්නා වූ ද,
සෑම අවස්ථාවක දී ම රජයේ නිලධරයකු හෝ නිල තත්ත්වයකින් කටයුතු කරන වෙනත් තැනැත්තකු විසින් හෝ එම නිලධරයාගේ හෝ තැනැත්තාගේ මුල්වීමෙන් හෝ කැමැත්ත ඇතිව හෝ එම නිලධරයාගේ හෝ තැනැත්තාගේ විරුද්ධ නොවීම මත කරන්නා වූ ද, යම් ක්‍රියාවක් අදහස් වේ.

## උපලේඛනය

(7 වන වගන්තිය)
ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනත සංශෝධනය කිරීම.

ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනතේ උපලේඛනය. එම 'බී' කොටසට පෙරාතුවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :
"(89) වධදීම"

හිංසකයන් උපන්නා නොව....
ඔවුන් පෝෂණය වූ
පුහුණු වූ හා
සහයෝගය
ලද අය වේ.

ISBN 995-8929-00-X